# 1. 1959 ආර්ථික හැඩගැස්ම

## (අ) හැඳින්වීම

පසුගිය වාර්ෂික වාර්තාවේ දැක්වූ පරිදි, මූල්‍ය තත්ත්වය විස්තර කිරීමට (2 වැනි කොටස) පෙරාතුව, දිවයිනේ ආර්ථික හැඩගැස්ම පිළිබඳ සමාලෝචනයක් (1 වැනි කොටස) මෙහි ඇතුලත් කොට ඇත. ඉන් පසුව 1959 වර්ෂයේ දී ඇති වූ ආර්ථික සහ මූල්‍ය වෙනස්කම්වලින් උද්ගත වූ ප්‍රධාන ප්‍රශ්නයන් සහ එම ප්‍රශ්න නිරාකරණය කිරීමට මුදල් මණ්ඩලය අනුගමනය කළ ප්‍රතිපත්ති සහ විධිවිධාන පෙන්වා ඒ සම්බන්ධ විග්‍රහයක් දී ඇත.

1959 මේ පිළිබඳව වූ ආර්ථික හැඩගැසීම් ස්වරූපය ප්‍රධාන දර්ශක කිහිපයක් අනුව වටහා ගත හැක. මේ වර්ෂයේ නිර්යාත ඉතා සතුටුදායක තත්ත්වයක පැවතුනේය. මුළු නිර්යාතවලින් ලැබුණ ආදායම පසුගිය වර්ෂයට වඩා අධික වුව ද, ලංකා ආර්ථික ඉතිහාසයෙහි සටහන් වී ඇති විශාලතම විදේශීය වෙළඳ අවාසිය 1959 වර්ෂයේ දී ඇති විය. මෙතෙක් නොවූ වාර්තාවක් පිහිටුවමින් රුපියල් කෝටි 25.1ක් වූ විදේශීය වෙළඳ අවාසිය ඇති වූයේ විදේශීය වෙළඳ අනුපාතයෙහි (නිර්යාත මිල ආයාත මිල හා සසඳන විට) දියුණුවක් තිබිය දීම ය. මේ වර්ෂයේ දී විශේෂයෙන් අවුරුද්දේ අවසාන කාර්තුවේ දී, පිට රටින් ගෙන්වූ බඩුවලට ගෙවූ මුදල් ප්‍රමාණය පෙර නොවූ විරූ ලෙස ඉහළ ගියේය.

1959 ලංකාවේ ජාත්‍යන්තර ගනුදෙනු තත්ත්වය පිරිහීමට හේතු වූයේ ප්‍රධාන වශයෙන් මේ අධික විදේශීය වෙළඳ අවාසියයි. මෙහි ප්‍රතිඵලය වූයේ විදේශීය වත්කම් තත්ත්වය වඩාත් දුර්වල වීමය. මේ වර්ෂය තුල දී ලංකාවේ විදේශීය වත්කම් රුපියල් කෝටි 88.3 සිට කෝටි 68.9ට පහළ වැටිණ. මෙසේ විදේශීය වත්කම් අඩු වුව ද, ස්ථාවර සහ ඉතිරිකිරීම් තැන්පතු වැඩි වුව ද, 1959 දී මුදල් සැපයුමෙහි ප්‍රසාරණයක් දක්නට ලැබිණ. මුදල් සැපයුම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රජයේ මුදල් ප්‍රතිපත්තියයි. 1958/59 දී ඇති වූ අති විශාල වූ අය වැය හිඟය පියවීම පිණිස රජයට ප්‍රමාණවත් ලෙස මහ බැංකුවෙන් ණය ගැනීමට සිදු විය. කාලයක සිට ම පැවතුන අය වැය හිඟයන් වැඩි වශයෙන් ම බල පෑවේ දේශීය මිල කෙරෙහි නොව ආයාත පරිමාව කෙරෙහිය. මේ බලපෑම විදේශීය වත්කම් පිරිහීමෙන් පිළිබිඹු වෙයි.

සැලැස්මක් අනුව රටේ ආර්ථික සංවර්ධනයෙහි දියුණුවක් ඇතිවීමට පෙර අය වැය හිඟයන් මෙ පරිදි ඉහළ යාම සතුටට කරුණක් නොවේ. නිර්යාත ආදායමත්, දේශීය නිෂ්පාදනයත් ඉහළ යාම නිසා ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතය මඳක් වැඩි විය. නමුත් ජනගහණයේ වැඩිවීම හා සලකා බලන විට, 1959 දී ලංකාවේ ඇති වූ ආර්ථික සංවර්ධනය ඉතා දුර්වල, බව සැළකිය යුතුය.

## (ආ) ජාතික නිෂ්පාදිතය සහ ආදයම

අනිකුත් නොදියුණු රටවල මෙන් ම ලංකාවේ ද සමහර ආර්ථික අංශයන්හි සංඛ්‍යා තොරතුරුවල ඇති අඩු පාඩු කම් නිසා ජාතික ආදයම මැනීම පැටලිලි සහිතව පවතී. ආර්ථික ආකෘතියෙහි පවත්නා පිළිවෙල නිසා සංඛ්‍යා තොරතුරු රැස් කිරීම ඉතා අපහසු වී ඇත. මේ නිසා පහළ දක්වා ඇති ඇස්තමේන්තුවල වැරදි නැත්තේ නොවේ. නමුත් ලංකාවේ ප්‍රධාන ආර්ථික උපනිතියන් පිළිබිඹු කිරීමේ ලා මේ ප්‍රයෝජනවත් වෙයි. 1959 යේ තාවකාලික සංඛ්‍යා තොරතුරු මහ බැංකුවෙන් සම්පාදනය වූ අතර, පසු ගිය අවුරුද්ද පිළිබඳ පළ කරන ලද සංඛ්‍යා තොරතුරු පිළියෙළ කරන ලද්දේ, වැඩි වශයෙන් සංඛ්‍යා සහ ජන ලේඛන දෙපාර්තමේන්තුව මගිනි. පසුව ලැබුණ සංඛ්‍යා තොරතුරු අඩංගු කිරීම නිසා, 1958 දී පළ කරන ලද සංඛ්‍යා තොරතුරු මෙයට වෙනස් වෙයි.

පවත්නා සාධක වියදම අනුව 1959 යේ ජාතික නිෂ්පාදිතය රුපියල් කෝටි 567·7 ට තාවකාලික වශයෙන් ඇස්තමේන්තු කර ඇත. මුදල් ප්‍රමාණයෙන් මනින කළ ගිය අවුරුද්දට වඩා මේ අවුරුද්දේ වැඩිවීම සියයට 4·8 කි. මූර්ත ප්‍රමාණයෙන් මනින කළ මේ වැඩිවීම සියයට 3·8 කි. ජනගහණය සියයට 2·5 කින් වැඩි වීම නිසා එක් අයෙකුට වැටෙන මූර්ත නිෂ්පාදනය සියයට 1·3 කින් වැඩිවිය. වැඩි වූ මූර්ත සම්පත්වලින් සියයට 57 ක් පාරිභොජනය (සඳහා වෙන් වූ අතර පුද්ගලික හා රජයේ) දළ ප්‍රාග් ධන සම්පාදනය සඳහා සියයට 27 ක් වෙන් විය.

1959 යේ දළ ජාතික නිෂ්පාදනය වර්ධනය වීමට හේතු වූයේ, දේශීය පාවිච්චිය සඳහා වූ සේවා හා භාණ්ඩ නිෂ්පාදනයේ වැඩිවීමත්, ආයෝජන ප්‍රමාණයෙහි වූ ඉහළ යාමත්, නිර්යාත වටිනාකම මදක් වැඩිවීමත් යන කරුණු ය. දළ ජාතික නිෂ්පාදිතයෙහි ප්‍රධාන සම්පාදිතයන්ගේ ගිය අවුරුදු තුනෙහි වූ චලනයන් පහත දැක්වෙන සටහනෙහි දක්වා ඇත.

### සටහන 1—1

### පවත්නා සාධක වියදම් අනුව දළ ජාතික නිෂ්පාදිතය

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂ | 1957 | 1958* | 1959 | 1958 සිට 1959 දක්වා වූ වෙනසෙහි සියයට ගණන |
|---|---|---|---|---|
| 1. දේශීය නිර්යාත ... ... ... ... ... | 1538 | 1613 | 1648 | 2·17 |
| 2. නිපදවා පාරිභෝජනය කළ දේශීය භාණ්ඩ ... | 1375 | 1463 | 1532 | 4·72 |
| 3. වෙළඳාම ... ... ... ... ... .. | 354 | 402 | 434 | 7·96 |
| 4. ගමනාගමනය ... ... ... ... ... | 258 | 267 | 277 | 3·75 |
| 5. වෘත්තිය, ගෘහ සේවක සහ පෞද්ගලික සේවා ... | 409 | 428 | 442 | 3·27 |
| 6. රජය ... ... ... ... ... | 602 | 634 | 662 | 4·42 |
| 7. ප්‍රාග් ධන වර්ධනය ... ... ... ... | 479 | 512 | 572 | 11·72 |
| 8. ගෙවල් කුලී... ... ... ... ... ... | 125 | 124 | 131 | 5·65 |
| **දළ දේශීය නිෂ්පාදිතය ... ... ... ... ...** | **5,140** | **5,443** | **5,698** | **4·68** |
| 9. පිටරටින් ලැබූ සාධක ආදයම ... ... | 60 | 50 | 48 | —4·00 |
| **දළ නිෂ්පාදිත ... ... ... ... ...** | **5,203** | **5,493** | **5,746** | **4·61** |
| 10. පිට රටවල ගෙවූ සාධක ආදයම ... ... | 92 | 77 | 69 | —10·39 |
| **දළ ජාතික නිෂ්පාදිතය ... ... ... ...** | **5,108** | **5,416** | **5,677** | **4·82** |

සංඛ්‍යා හා ජනලේඛන දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යා අනුවයි

නියම ආර්ථික තත්වය කොතරම් දියුණු වී තිබේදැයි සොයා බැලීමට ඉහත සටහනේ දැක්වෙන ජාතික ආදයම පිළිබඳ සංඛ්‍යා මිල වෙනස් වීම සඳහා ගලපා, ස්ථාවර මිල අනුව සකස් කළ යුතු ය. 1956 යේ මිල ගණන් අනුව මූර්ත නිෂ්පාදිතය ගුණනය කොට පහත දැක්වෙන සටහනෙහි පෙන්වා ඇත.

* 1958 සංඛ්‍යා, සංශොධිත සංඛ්‍යා වෙයි. මේවා ගිය අවුරුද්දේ වාර්ෂික වාර්තාවේ පළ කරන ලද තාවකාලිකව ඇස්තමේන්තුවල සංඛ්‍යාවල ස්ථානය ගනී.

## සටහන 1 — 2

### 1957 — 59 තුළ දළ ජාතික නිෂ්පාදිතය, (1956) ස්ථාවර සාධක වියදම් මිල අනුව

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1956 | 1957 | 1958 | 1959 | 1958 සිට 1959 දක්වා වෙනස්වීමේ සියයට ගණන |
|---|---|---|---|---|---|
| 1. දේශීය නිර්යාත ... ... ... | 1,613 | 1,613 | 1,718 | 1,682 | —2·10 |
| 2. නිපදවා පාරිභෝජනය කළ දේශීය භාණ්ඩ ... ... ... | 1,292 | 1,337 | 1,369 | 1,446 | 5·62 |
| 3. වෙළඳාම ... ... ... ... | 334 | 337 | 340 | 367 | 7·94 |
| 4. ගමනාගමනය ... ... ... ... | 237 | 246 | 255 | 264 | 3·53 |
| 5. වෘත්තීය, ගෘහසේවා සහ පෞද්ගලික සේවා ... ... | 392 | 398 | 379 | 401 | 5·80 |
| 6. රජය ... ... ... | 566 | 587 | 605 | 634 | 4·79 |
| 7. ප්‍රාග් ධන වර්ධනය ... ... ... | 497 | 431 | 489 | 542 | 10·84 |
| 8. ගෙවල් කුලී ... ... ... ... | 108 | 122 | 118 | 125 | 5·93 |
| දළ දේශීය නිෂ්පාදිතය ... ... ... | 5,039 | 5,071 | 5,273 | 5,461 | 3·57 |
| 9. පිට රටින් ලැබූ සාධක ආදායම ... | 57 | 58 | 52 | 50 | —3·85 |
| දළ නිෂ්පාදිතය ... ... ... ... | 5,096 | 5,129 | 5,325 | 5,511 | 3·49 |
| 10. පිට රටවලට ගෙවූ සාධක ආදායම ... | 95 | 95 | 83 | 70 | —15·66 |
| දළ ජාතික නිෂ්පාදිතය ... ... ... | 5,001 | 5,034 | 5,242 | 5,441 | 3·80 |

සංඛ්‍යා හා ජනලේඛන දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යා අනුවයි.

**නිර්යාත**

දළ ජාතික නිෂ්පාදිතයෙහි සැළකිය යුතු ප්‍රමාණයක්, නිර්යාතයන් අඩංගු වේ. ජාත්‍යන්තර ගනු දෙනු කෙරෙහි නිර්යාතයන් ගේ වැදගත් කම නිසා, දළ ජාතික නිෂ්පාදිතයෙහි අඩංගු අනිකුත් දේවල වෙනස්වීම්වලට වඩා නිර්යාත ආදායමෙහි වෙනස්වීම් ගැන වැඩි සැලකිල්ලක් දක්වා ඇත. පසු ගිය සටහන් දෙකෙහි දක්වා ඇති නිර්යාත, ලංකාවේ නිපදවා පිට රට විකුණූ භාණ්ඩ වෙයි. සේවා නිර්යාතයන් මේ සටහන් වල අන්තර්ගත කර නැත. එය පසුව දළ ජාතික නිෂ්පාදිත වියදම් පෙන්වන සටහනින් දක්වේ. 1959 යේ දී දළ ජාතික නිෂ්පාදිතයේ මේ නිර්යාතයන්ගේ අනුපාතය සියයට 29·0 ක් වූ අතර 1958 දී සියයට 29.4 ක් ද, 1956 දී සියයට 32 ක් ද විය. මේ අනුපාතයේ අඩුවීම නිත්‍ය අඩුවීමක්දැයි පෙන්වීමට මේ සංඛ්‍යාවලින් අපහසුය.

1958 ටවඩා නිර්යාතයන්ගේ වටිනා කම සියයට 2.2 කින් ඉහළ ගොස් ඇත. පරිමාව සියයට 2·1 කින් පහළ වැටුණ ද මිල සියයට 4·3 කින් ඉහළ නැංගේ ය.

**තේ.**

1959 අවසානයේ දී සම්පූර්ණ තේ අක්කර ගණන 5, 79,600 ක් වූ අතර 1958 අවසානයේ දී එය අක්කර දහස් 5,72,700 ක් ව තිබුණේ ය. 1958 දී රාත්තල් කෝටි 41.3 ක් වූ තේ නිෂ්පාදනය 1959 දී රාත්තල් 25,000 කින් පමණ මඳකින් අඩු වී ඇති බව පෙනෙනු ඇත. එසේ වුව ද 1958 තේ නිෂ්පාදනය රාත්තල් දශ ලක්ෂ 8 ක් ම වැඩි ව ඇස්තමේන්තු වී ඇති බැව් දැන් සලකනු ලැබේ. මේ වැඩි ඇස්තමේන්තුව ඉවත් කළ විට 1959 යේ තේ නිෂ්පාදනය 1958 ට වඩා සියයට 1·9 කින් ඉහළ ගොස් ඇති බැව් පෙනේ. මේ වර්ධනයේ ශීඝ්‍ර තාවය පසුගිය දස අවුරුද්ද තුල සියයට 4 ක්ව පැවතුන සාමාන්‍ය වර්ධන ශීඝ්‍රතාවට වඩා අඩුය.

තේ අස්වැන්න 1959 දී අක්කරයකට රාත්තල් 714 ක් වූ අතර 1958 දී රාත්තල් 704 කුත් 1957 දී රාත්තල් 697 කුත් ලැබී ඇත. අස්වැන්න කෙමෙන් දියුණු වීමට හේතු වූයේ වැඩි- වැඩියෙන් පෝර යෙදීමත් අනිකුත් වැඩි දියුණු කිරීම් ඇතිකිරීමත් නිසාය. තේ නැවත වගාකිරීමේ ආධාර ක්‍රමය යටතේ 1959—65 දක්වා වූ කාලය අතර අක්කර 30,000 ක පැරණි තේ වෙනුවට වැඩි අස්වැන්න ලැබෙන වර්ගයේ තේ වගාකිරීමේ වැඩ පිළිවෙළ නිසා අනාගතයේදී අස්වැන්න සහ නිෂ්පාදනය ඉහළ අතට හැරෙන්ට ඉඩ තිබේ.

සම්පූර්ණ තේ නිෂ්පාදනයෙන් දේශීය පාරිභෝජනය සඳහා වෙන් වන්නේ ඉතා සුළු කොටසෙකි. 1959 දී දේශීය පාරිභෝජනය රාත්තල් දශ ලක්ෂ 26 ක් පමණ බව ඇස්තමේන්තු කොට ඇත. ලංකාවේ එක් අයෙකු වර්ෂයකට තේ රාත්තල් 2.7 ක් පාවිච්චි කරයි. මෙය එක්සත් රාජ්‍යයේ එක් අයෙකු පාවිච්චි කරන ප්‍රමාණයෙන් හතරෙන් එකක් පමණ වෙයි.*

සම්පූර්ණ තේ නිර්යාත (රාත්තල් කෝටි 38.4) 1958 ප්‍රමාණයට වඩා සියයට 7 කින් අඩු වූ අතර වටිනාකම සියයට 8 කින් පහළ බැස්සේ ය.

**රබර්**

1958 නිෂ්පාදනය වූ රාත්තල් කෝටි 22.4 සිට 1959 දී රාත්තල් කෝටි 205 දක්වා රබර් නිෂ්පාදනය ශීඝ්‍රයෙන් පහළ බැස්සේය. සියයට 8 ක් පමණ වූ මේ ශීඝ්‍ර පහළ බැසීමට හේතු වූයේ අවුරුද්දේ මුල් ත්‍රෛමාසිකය තුල ඇති වූ තද නියඟයත්, පරණ ගස් උදුරා සිට වූ අස්වැන්න වැඩි අලුත් වගාවෙන් තව ම පළදාව නො ලැබීමත්ය.

1958 අවසානයේ දී 6,64,800 ක් වූ රබර් අක්කර ප්‍රමාණය 1959 අවසානය වන විට අක්කර 6,68,200 දක්වා වැඩි විය. මේ අක්කර ප්‍රමාණයෙන් 1959 දී පලදාව ලැබුනේ අක්කර සියයට 83 කින් පමණක් බව ඇස්තමේන්තු කොට ඇත. දැනට පලදාව ලැබෙණ අක්කර ප්‍රමාණය ගැන සලකා බලන කල සමහරකින් සම්පූර්ණ පලදාව නොලැබීම නිසා අක්කරයක සාමාන්‍ය අස්වැන්න 1958 වේ රාත්තල් 412 සිට 1959 වන විට රාත්තල් 370 දක්වා ශීඝ්‍රයෙන් පහළ බැස්සේ ය.

1959 දී රබර් රාත්තල් දශ ලක්ෂ 206 ක් පිට රට යවන ලදී. මෙය ගිය අවුරුද්දේ ප්‍රමාණයට වඩා මඳක් අඩුය. නමුත් මිල ගණන් වල ඊට සමානව වැඩිවීමක් ඇති හෙයින් රබර්වල වටිනාකම රුපියල් කෝටි 29.8 ක් විය. මෙය ගිය අවුරුද්දේ වටිනාකමට වඩා සියයට 16 කින් වැඩි විය.

දේශීය පාරිභොජනය සඳහා අවශ්‍ය රබර් ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂයකටත් වඩා අඩුය.

**පොල්**

ලංකාවේ පොල් නිෂ්පාදනය පිළිබඳ අවක්‍ර ඇස්තමේන්තු නොමැතිවීමට ප්‍රධාන හේතුව වශයෙන් සැළකිය හැක්කේ කැබලි වශයෙන් ඇති කුඩා වගාවන් බොහෝ වීමය. දැනට ඇති ඇස්තමේන්තු, පොල් නිර්යාත සංඛ්‍යා සහ ජනගහණය පදනම් කොට සකස් කොට ඇත. නිෂ්පාදනය පිළිබඳව ඇති ඇස්තමේන්තු වෙනස් වී ඇත්තේ නිර්යාතයන් ගේ වෙනස්වීම් නිසාය.

1959 ඇස්තමේන්තුව අනුව 1959 නිෂ්පාදනය කෝටි 230 කි. මෙය ගිය අවුරුද්දේ පලදාවට වඩා සියයට 13 කින් වැඩිය. මේ වැඩිවීමට හේතුව වශයෙන් සැළකිය හැක්කේ වැඩි වශයෙන් පොහොර යෙදීමය. රජයේ පොල් පොහොර ආධාර ක්‍රමය යටතේ 1959 දී පෝර ටොන් 44,000 පමණ බෙද හරින ලදී. 1958 දී බෙද හරින ලද පෝර ප්‍රමාණය ටොන් 34,750 ක් විය. මේ ක්‍රමය ඇරඹීමට පෙර අවුරුදු වල දී වාර්ෂිකව යෙදූ සාමාන්‍ය පෝර ප්‍රමාණය ටොන් 12,000 ක් පමණ විය.

ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනෙහි නිර්යාත, කොප්පරා සමානත්වයෙන් බලන කල ගිය අවුරුද්දට වඩා සියයට 28 කින් ඉහළ ගොස් ඇත. මිළ ඉහළ යාම නිසා කෝටි 24.3 ක් වූ නිර්යාතයෙහි වටිනාකම 1958 ට වඩා සියයට 49 කින් ඉහළ ගියේ ය.

* 1957 දී ඉන්දියාවේ එක් අයෙකු වර්ෂයකට තේ රාත්තල් 0.63 ක් පාවිච්චිකර ඇත. (ජාත්‍යන්තර තේ කාරක සභාවේ සංඛ්‍යා ලේඛන නිවේදනය.)

**නිර්යාත සහ විදේශීය වෙළඳ අනුපාතය.**

විදේශීය වෙළඳ අනුපාතයෙන් පෙන්වන්නේ ලංකාවේ ආයාත ඒකකයක් ලබා ගැනීමට ගෙවිය යුතු නිර්යාත ප්‍රමාණයයි. දළ ජාතික නිෂ්පාදිතයේ සැළකිය යුතු කොටසක් නිර්යාත වන නිසා විදේශීය වෙළඳ අනුපාතයේ වෙනස් වීම මූර්ත ජාතික ආදයම් මට්ටම නියම කිරීමෙහි ලා වැදගත් වේ.

1959 පිළිබඳ වූ විදේශීය වෙළඳ අනුපාතය 1958 වර්ෂයට වඩා සියයට 5 කින් වැඩිය. මෙයට හේතු වූයේ නිර්යාත මිල සියයට 4 කින් ඉහළ යාමත් ආයාත මිල සියයට 1 කින් පහළ බැසීමත්ය.

ලංකාවේ මූර්ත ජාතික ආදයම කෙරෙහි විදේශීය වෙළඳ අනුපාතයේ බල පෑම 1 — 3 යන සටහනින් දැක්වේ.

**සටහන 1—3**

**ලංකාවේ මූර්ත ජාතික ආදයමෙහි විදේශීය වෙළඳ අනුපාතයේ බලපෑම**

**( 1956 මිල )**

රුපියල් ලක්ෂ

| වර්ෂය | විදේශීය වෙළඳ අනුපාතයේ බලපෑම හැර මූර්ත ජාතික ආදයම | විදේශීය වෙළඳ අනුපාත බලපෑම | | | | විදේශීය වෙළඳ අනුපාත බලපෑම ඇතුළු මූර්ත ජාතික ආදායම |
|---|---|---|---|---|---|---|
| | | තේ මගින් | රබර් මගින් | අනිකුත් නිර්යාත මගින් | මුළු ගණන | |
| 1956 ... | 5,001 | — | — | — | — | 5,001 |
| 1957 ... | 5,186 | —160 | —105 | +113 | —152 | 5,034 |
| 1958 ... | 5,301 | —60 | —44 | +45 | —59 | 5,242 |
| 1959 ... | 5,417 | —36 | +46 | +14 | +24 | 5,441 |

1959 දී මූර්ත ආදයමෙන් 0·5 ක් විදේශීය වෙළඳ අනුපාතයේ බලපෑම නිසා විය. එය 1958 සහභාගයට වඩා රුපියල් කෝටි 8.30 කින් එනම් සියයට 1.52 කින් වැඩි විය.

**දළ ජාතික නිෂ්පාදිතයෙහි කාර්මික සැකැසුම**

අර්ථ ක්‍රමයේ එක් එක් අංශයන් එකි නෙකට ඇති වැදගත්කම දළ ජාතික නිෂ්පාදිතයෙහි කාර්මික සැකැසුම ගණනය කිරීමේ දී පැහැදිළි වෙයි. පහත දැක්වෙන සංඛ්‍යා සටහනින් ගත වූ අවුරුදු හතර තුළ එවැනි විස්තර දැක්වේ. මේ සටහනින් අර්ථ ක්‍රමයේ සාමාන්‍ය සැලැස්ම පිළිබඳ ප්‍රයෝජනවත් කරුණු පෙන්වන අතර ඒ සැලැස්මෙහි සමහර වෙනස්වීම් ද දක්වයි.

### සටහන 1 — 4

## සාධක වියදම් අනුව දළ ජාතික
## නිෂ්පාදිතයෙහි කාර්මික සැකැසුම්.

රුපියල් දශ ලක්ෂ

| කර්මාන්තය | 1956 රු. දශ ලක්ෂ | 1956 සියයට ගණන | 1957 රු. දශ ලක්ෂ | 1957 සියයට ගණන | 1958 රු. දශ ලක්ෂ | 1958 සියයට ගණන | 1959 රු. දශ ලක්ෂ | 1959 සියයට ගණන | 58 සිට වෙනස්වීමේ සියයට ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| **මූලික.** | | | | | | | | | |
| 1. කෘෂිකර්මාන්තය (1) හා ධීවර කර්මාන්තය | 2552 | 50·64 | 2535 | 49·32 | 2637 | 48·45 | 2709 | 47·54 | 2·73 |
| **ද්විතීය.** | | | | | | | | | |
| 2. පතල් හා ගල් කැනීමේ කර්මාන්තය | 17 | 0·34 | 17 | 0·33 | 10 | 0·18 | 15 | 0·26 | 50·00 |
| 3. නිපදවීම් හා හස්ත කර්මාන්ත ... | 261 | 5·18 | 281 | 5·47 | 323 | 5·94 | 344 | 6·04 | 6·50 |
| 4. ගොඩනැගිලි කර්මාන්ත ... | 459 | 9·11 | 451 | 8·77 | 496 | 9·11 | 539 | 9·46 | 8·67 |
| **තෘතීය.** | | | | | | | | | |
| 5. ගමනාගමනය හා පණිවුඩ හුවමාරුව ... | 306 | 6·07 | 327 | 6·36 | 342 | 6·28 | 362 | 6·36 | 5·85 |
| 6. තොග බඩු හා සිල්ලර වෙළඳාම ... | 414 | 8·22 | 431 | 8·39 | 482 | 8·86 | 516 | 9·05 | 7·05 |
| 7. ගෙවල් අයිතිය ... | 108 | 2·14 | 125 | 2·43 | 124 | 2·28 | 131 | 2·30 | 5·65 |
| 8. රාජ්‍ය පාලනය හා ආරක්ෂාව | 273 | 5·42 | 286 | 5·56 | 287 | 5·27 | 289 | 5·08 | 0·70 |
| 9. සේවා | | | | | | | | | |
| (අ) රජයේ සමාජ සේවා ... ... | 257 | 5·10 | 278 | 5·41 | 314 | 5·77 | 349 | 6·12 | 11·15 |
| (ආ) අනෙකුත් ... | 392 | 7·78 | 409 | 7·96 | 428 | 7·86 | 444 | 7·79 | 3·74 |
| දළ ජාතික නිෂ්පාදිත | 5039 | 100·00 | 5140 | 100·00 | 5443 | 100·00 | 5698 | 100·00 | 4·68 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

සංලක්ෂය— (1) තේ සහ රබර් නිෂ්පාදනයෙන් කර්මාන්තයට ලැබෙන ආදයම ඇතුලත් වෙයි. ආර්ථික කටයුතු ඉහත දක්වෙන ලෙස වර්ග කර ඇත්තේ එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර කර්මාන්ත වර්ගීකරණයට අනුකූලවය. නමුත් තේ හා රබර් සම්බන්ධයෙන්, කෘෂිකර්මයෙන් කර්මාන්තයට ලැබෙන වටිනාකම වෙන් කළ නො හැක. මෙසේ වී ඇත්තේ තොරතුරුවල හිඟකම නිසාය. එබැවින් කෘෂිකර්මයෙන් ලැබෙන ආදයම ප්‍රමාණාධිකව ඇස්තමේන්තු වී ඇත.

**කෘෂිකර්මය**

ඉහළ දක්වා ඇති සටහනෙහි පෙනෙන වැදගත් ලක්ෂණයක් නම් ලංකාවේ දළ දේශීය නිෂ් පාදිතයේ කෘෂි කර්ම කොටස පහළ බැසීමයි. 1956—1959 අතර මේ කොටස සියයට 3.1කින් පහළ බැස්සේ ය. මෙහි පහළ බැසීමේ වාර්ෂික ශීඝ්‍රතාවය සියයට 0.95 කි. තේ සහ රබර් කර්මාන්තයන්ගේ ආදයම කෘෂිකාර්මික ආදයමෙන් වෙන් කළේ නම් කෘෂිකාර්මික කොටස මීට වඩාත් පහළ බසින්නට තිබිණ.

1959 දී කෘෂිකාර්මික නිෂ්පාදිතයන් ගේ වටිනාකම සියයට 2.7 කින් ඉහළ නැංගේය. 1958 දී වටිනාකම රුපියල් කෝටි 263.7 ක් වූ අතර, 1959 දී රුපියල් කෝටි 270.7 ක් විය. මේ දියුණුව ඇති වූයේ ප්‍රධාන වශයෙන් නිර්යාතයන් ගේ මිල ගණන් වල ඉහළ යාම හේතු කොට ගෙනය කෘෂිකාර්මික නිෂ්පාදනයින් විසින් මිල දී ගත් නිෂ්පාදනය උපකරණ මිල ඉහළ නැං ගේ අඩු වේගයකිනි. යෙදවුම- නිපැයුම අනුව විග්‍රහයක් කිරීමට හෝ, කෘෂි භෝග නිෂ්පාදන අනිකුත් ආර්ථික අංශයන් සමග කෙරෙන ගනුදෙනුවල වෙළඳ අනුපාතය සකස් කිරීමට හෝ, දක්වා ඇති සංඛ්‍යා තොරතුරු වලින් පමණක් උගහටය.

**වී ගොවිතැන**

1958 දී බුසල් කෝටි 3.66 ක වාර්තාවක් පිහිට වූ වී නිෂ්පාදනය, තාවකාලික ඇස්තමේන්තු අනුව 1959 දී බුසල් දශලක්ෂයකින් පමණ පහළ බැස ඇති බව පෙනේ. මාස් කන්නයේ අස්වැන්න බුසල් කෝටි 2.12 සිට බුසල් කෝටි 2.16 දක්වා වැඩි වුව ද යල් කන්නයේ අස් වැන්න බුසල් කෝටි 1.54 සිට බුසල් කෝටි 1.42 දක්වා පහළ වැටිණ. යල් කන්නයේ දි අස්වැන්න පහළ වැටීමට ප්‍රධාන හේතුව වූයේ අයහපත් කාල ගුණය නිසා 1959 දී අස්වැන්න ලබාගත් අක්කර ගණන 60,000 කින් පමණ අඩු වීමය. යල් කන්නයේ අස්වැන්න පහළ වැටුන ද, වැඩියෙන් පෝර යෙදීම නිසාත්, දියුණු ක්‍රම අනුව ගොවිතැන් කිරීම නිසාත් නිෂ්පාදනය ගිය අවුරුද්දේ මෙන් ම ඉහළ මට්ටමට පැවතිණ.

සහල් ප්‍රමාණය අනුව දේශීය වී නිෂ්පාදනය 1959 දී ටොන් 5,08,600ක් විය. 1958 දී මෙය ටොන් 5,22,900 ක් විය. 1958 දී ටොන් 475,000 ක් වූ සහල් ආයාතය 1959 දී ටොන් 5,74,000 දක්වා ඉහළ ගියේය. රජයේ සහල් තොග ප්‍රමාණය 1958 දී ටොන් 1,13,900 ක් වූ අතර 1959 දී ටොන් 1,66,800 ක් විය.

**නිපදවීම සහ හස්තකර්මාන්ත**

දළ ජාතික නිෂ්පාදිතයෙහි නිපදවීම් සහ හස්ත කර්මාන්තයන් ගේ කොටස 1958 සහ 1959 කාලය අතර සියයට 0.86 ක් ඉහළ ගොස් ඇත. ගිය අවුරුදු හතර තුළ වූ මෙහි නිෂ්පාදනය වැඩි වීමේ සාමාන්‍ය වාර්ෂික ශීඝ්‍රතාවය සියයට 7.2කි.

1958 දී කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කාර්මික නිෂ්පාදන දර්ශකයේ පෙන්වා ඇති පරිදි, කාර්මික නිෂ්පාදනය සියයට 4 කින් පහළ බැස ඇත. මේ අඩුවීමට ප්‍රධාන හේතුන් වූයේ 1957 දෙසැම්බර් මාසයේ වූ ජල ගැල්ම, කම්කරු නොසන්සුන් කම හා ජාති බේද කෝලාහලය. මිනිරන්, ලුණු හා තලාතු මිනිරන් මේ දර්ශකයට ඇතුළත් වුව ද දළ ජාතික නිෂ්පාදිතය යටතේ වර්ග කිරීමේ දී මේවා පතල් කර්මාන්තය හා ගල් කැනීම යන ශීර්ෂ යටතේ ගැනෙයි. මේවා ඉවත් කළ විට කාර්මික නිෂ්පාදන දර්ශකය සියයට 3 ක අඩු වීමක් දක්වයි.

සමහර කර්මාන්තයන් සම්බන්ධව ලැබී ඇති තාවකාලික සංඛ්‍යා තොර තුරු අනුව සිමෙන්ති, සිගරැට්, කපු රෙදි සහ පදම්කළ හම් යන භාණ්ඩයන්හි නිෂ්පාදනය වැඩි වී ඇති අතර, තුනී ලෑලි තේ පෙට්ටි, ගිනි පෙට්ටි, සිසිල් බීම ආදියෙහි නිෂ්පාදනය අඩු වී ඇති බැව් පෙනේ. සමහර කර්මාන්ත සඳහා 1958 හා 1959 යේ නිෂ්පාදනය ඇස්තමේන්තු පහත සටහනින් දක්වේ.

### සටහන 1—5
### නිෂ්පාදනය—තෝරා ගත් කර්මාන්ත

| ශීර්ෂ | ඒකකය | 1958 | 1959* | 1959/1958 වෙනසේ සියයට ගණන |
|---|---|---|---|---|
| සිසිල් බීම .. .. .. | දුසිම | 3,329,146 | 3,011,304 | — 9.5 |
| සුවඳ සබන් .. .. .. | රාත්තල් දහස් | 4,029 | 3,259 | —19.1 |
| රෙදි සෝදන සබන් .. .. .. | ,, | 29,999 | 22,987 | —23.4 |
| සිගරැට් .. .. .. | ,, | 1,588,218 | 1,842,249 | +16.0 |
| සිමෙන්ති.. .. .. .. | ටොන් | 79,079 | 80,906 | + 2.3 |
| තුනී ලෑලි .. .. .. | වර්ග අඩි | 6,877,675 | 6,736,783 | — 2.0 |
| තේ පෙට්ටි .. .. .. | ගණන | 160,475 | 119,247 | —25.7 |
| ගිණි පෙට්ටි .. .. .. | ග්‍රෝස් (144) | 1,236,205 | 1,093,246 | —11.6 |
| කපු රෙදි .. .. .. | වර්ග යාර | 7,072 | 7,129 | + 0.8 |
| පාවහන් .. .. .. | ජෝඩු | 1,498,015 | 1,152,222 | —23.1 |
| පදම් කළ හා නොකළ හම් (හරක් සහ මීහරක්) .. .. | රාත්තල් දහස් | 2,751 | 3,612 | +31.3 |

* තාවකාලික

සංඛ්‍යා—කර්මාන්ත දෙපාර්තමේන්තුවෙනි.

**සේවා**

රජයේ සහ පෞද්ගලික සේවාවන් ගේ ඒකාබද්ධ ආදයම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13 ක් පමණ වෙයි. 1959 දී පසු ගිය අවුරුද්දට වඩා රජයේ සමාජ සේවා වියදම සියයට 11 කින් ඉහළ ගිය අතර පෞද්ගලික අංශයේ සේවාවන්ගෙන් ලැබුණ ආදයම සියයට 3.7 කින් ඉහළ ගියේය. විශේෂයෙන් ආයාත හා නිර්යාතයන්ගේ වැඩිවීම නිසා පෞද්ගලික අංශයේ භාණ්ඩ බෙදා හැරීමෙහි දියුණුවක් විය.

පෞද්ගලික අංශයේ සේවාවන්ගේ ආදයම තක්සේරු කිරීමේ දී වැලැක්විය නො හැකි අඩු ලුහුඩු කම් ඇති වේ. වෙළඳ සේවා සහ පෞද්ගලික සේවා ආදී සමහර සේවා ඉතා අඩු ලෙස ඇස්තමේන්තු විය හැක.

**දළ ජාතික වියදම**

පවත්නා වෙළඳ මිල සහ පවත්නා සාධක වියදම් මිලට අනුව ජාතික දළ වියදමේ ප්‍රධාන වියදම් ශීර්ෂ පිළිබඳ වලනයක් පහත සටහනින් දැක්වේ.

### සටහන 1–6
### පවත්නා වෙළඳ මිල සහ සාධක වියදම් මිල අනුව දළ ජාතික වියදම

| | පවත්නා වෙළඳ මිල අනුව | | | | සාධක වියදම් මිල අනුව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1957 | 1958 * | 1959 | 1958–59 අතර වෙනස සියයට ගණන | 1957 | 1958 * | 1959 | 1958–59 අතර වෙනස සියයට ගණන |
| 1. පෞද්ගලික පාරිභෝජනය .. | 4093 | 4241 | 4451 | 4·95 | 3848 | 3995 | 4198 | 5·08 |
| 2. රජයේ පාරිභෝජනය .. | 719 | 830 | 883 | 6·39 | 719 | 830 | 883 | 6·39 |
| 3. දළ පෞද්ගලික ප්‍රාග් ධන සම්පාදනය .. .. | 320 | 312 | 389 | 24·68 | 305 | 295 | 345 | 16·95 |
| 4. දළ රජයේ ප්‍රාග් ධන සම්පාදනය | 377 | 412 | 487 | 18·20 | 362 | 395 | 467 | 18·23 |
| 5. භාණ්ඩ සහ සේවා නිර්යාත .. | 1954 | 1912 | 2066 | 8·05 | 1954 | 1912 | 2066 | 8·05 |
| දළ දේශීය නිෂ්පාදිතය හා ආයාත සඳහා වියදම් .. | 7463 | 7707 | 8276 | 7·38 | 7188 | 7427 | 7959 | 7·16 |
| 6. භාණ්ඩ සහ සේවා ආයාත | 2038 | 2001 | 2253 | 12·59 | 2038 | 2001 | 2253 | 12·59 |
| (සංඛ්‍යා ඌනතා) .. | — | — | — | — | —10 | +17 | —14 | — |
| දළ දේශීය නිෂ්පාදිතය .. | 5425 | 5706 | 6023 | 5·56 | 5140 | 5443 | 5698 | 4·68 |
| 7. ශුද්ධ විදේශීය සාධක ආදයම .. | —32 | —27 | —21 | —22·22 | —32 | —27 | —21 | —22·22 |
| 8. දළ ජාතික නිෂ්පාදිතය .. | 5393 | 5679 | 6002 | 5·69 | 5108 | 5416 | 5677 | 4·82 |

සංඛ්‍යා—සංඛ්‍යා හා ජනලේඛන දෙපාර්තමේන්තුවෙන් සහ මහ බැංකුවෙනි

* සටහන 1–1 ට ඇති අධෝ ලිපිය බලන්න.

ස්ථාවර වෙළඳ මිල සහ ස්ථාවර සාධක වියදම් මිල අනුව ප්‍රධාන වියදම් අංශයන් 1–7 වැනි සටහනේ දක්වා ඇත.

## සටහන 1—7

## 1956 ස්ථාවර මිල අනුව දළ ජාතික වියදම

රුපියල් දශ ලක්ෂ

| | වෙළඳ මිල අනුව | | | | සාධක වියදම මිල අනුව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1957 | 1958 * | 1959 | 1958—1959 අතර වෙනස සියයට ගණන | 1957 | 1958 * | 1959 | 1958—59 අතර වෙනස සියයට ගණන |
| 1. පෞද්ගලික පාරිභෝජනය ... | 3945 | 4117 | 4404 | 6·97 | 3659 | 3863 | 4062 | 5·15 |
| 2. රජයේ පාරිභෝජනය | 700 | 792 | 841 | 6·19 | 700 | 792 | 841 | 6·19 |
| 3. දළ පෞද්ගලික ප්‍රාග් ධන සම්පාදනය ... ... | 306 | 289 | 370 | 28·03 | 293 | 274 | 329 | 20·07 |
| 4. දළ රජයේ ප්‍රාග් ධන සම්පාදනය ... ... | 360 | 399 | 465 | 16·54 | 347 | 582 | 445 | 16·49 |
| 5. භාණ්ඩ සහ සේවා නිර්යාත ... ... | 2026 | 2036 | 2108 | 3·54 | 2026 | 2036 | 2108 | 3·54 |
| දළ දේශීය නිෂ්පාදිතය හා වියදම් ... ... | 7337 | 7633 | 8188 | 7·27 | 7025 | 7347 | 7785 | 5·96 |
| 6. භාණ්ඩ සහ සේවා ආයාත | 1945 | 2063 | 2347 | 13·77 | 1945 | 2063 | 2347 | 13·77 |
| සංඛ්‍යා ඌනතා ... | — | — | — | — | — 9 | —11 | +23 | — |
| දළ දේශීය නිෂ්පාදිතය ... | 5392 | 5570 | 5841 | 4·87 | 5071 | 5273 | 5461 | 3·57 |
| 7. ශුද්ධ විදේශීය සාධක ආදායම ... ... | —37 | —31 | —20 | —35·48 | —37 | —31 | —20 | —35·48 |
| 8. දළ ජාතික නිෂ්පාදිත ... | 5355 | 5539 | 5821 | 5·09 | 5034 | 5242 | 5441 | 3·80 |

සංඛ්‍යා—සංඛ්‍යා හා ජනලේඛන දෙපාර්තමේන්තුවෙන් සහ මහ බැංකුවෙනි.

සටහන් 1—1 වැනි අධෝ ලිපිය බලන්න.

### පාරිභෝජනය

1959 දී වෙළඳ මිල අනුව පෞද්ගලික පාරිභෝජන වියදම 1958 ට වඩා සියයට 5.0 කින් වැඩි විය. සාධක වියදම් මිල අනුව සියයට 5.1 කින් වැඩි විය. දළ ජාතික වියදමේ පෞද්ගලික පාරිභෝජන වියදම් කොටස 1957 දී සියයට 75 ක් ද, 1958 දී සියයට 73.8 ක් ද වූ අතර, 1959 දී සියයට 73.9 ක් විය. 1959 දී රජයේ පාරිභෝජනය මුල්‍ය ප්‍රමාණයෙන් සියයට 6.4 කින් ඉහළ ගියද, මූර්ත ප්‍රමාණයෙන් වැඩි වූයේ සියයට 6.2 කින් පමණකි. ජාතික දළ වියදමේ රජයේ විය දම්හි කොටස වැඩි වෙමින් පැවතිණ. මෙය 1957 දී සියයට 13.8 කින් ද 1958 දී සියයට 15.3 කින්ද 1959 සියයට 15.5 කින් ද වැඩි විය.

### ප්‍රාග් ධන සම්පාදනය

ප්‍රාග් ධන සම්පාදනය පිළිබඳ ඇස්තමේන්තු සකස් කොට ඇත්තේ දළ වශයෙනි. එබැවින් ඒවා පරීක්ෂාකාරීව සලකා බැලිය යුතුව ඇත. තොග වෙනස්වීම් විශෙෂයෙන් ආයාත තොග පිළිබඳ සංඛ්‍යා නොමැති හෙයින් මෙහි දක්වා ඇත්තේ ස්ථිර ආයෝජන පමණකි.

පවත්නා සාධක වියදම් මිළ අනුව දළ ප්‍රාග් ධන සම්පාදනය තාවකාලික ඇස්තමේන්තුවලින් පෙනී යන පරිදි ගිය අවුරුද්දට වඩා 1959 දී 17.7 කින් ඉහළ ගොස් ඇති බව පෙනේ. මූර්ත ප්‍රමාණයෙන් වැඩි වී ඇත්තේ සියයට 17.9 කි. දළ ජාතික නිෂ්පාදනයේ දළ ආයෝජනය සියයට 12.8 සිට සියයට 14.3 දක්වා ඉහළ ගොස් ඇත.

1959 දී දළ ප්‍රාග් ධන සම්පාදනයෙහි රාජ්‍ය අංශයේ සහභාගය සියයට 58 ක් වූ අතර, පෞද්ගලික අංශයේ සහභාගය සියයට 42 ක් විය. 1958 දී සියයට 64 ක් වූ ගොඩ නැගිලි සෑදීමේ පෞද්ගලික ආයෝජනය, 1959 දී සියයට 68 ක් විය. 1959 රජයේ ණය දීම සහ අයබදු සහන ඇති කිරීම නිසා ගොඩනැගිලි සෑදීම නව වාර්තාවක් පිහිටුවිණ. ගමනාගමනය පිළිබඳ කළ අලුත් ආයෝජන ගිය අවුරුද්දට වඩා වැඩි විය. රජයේ ආයෝජන සම්පාදනයේ ශීඝ්‍රතාව ගිය අවුරුද්දට වඩා වැඩියෙන් විය. රජයේ ප්‍රාග් ධනසම්පාදනයෙහි විශාල ඉහළ නැගීම ඇති වූයේ ගොඩනැගිලි සෑදීමේ කටයුතු ඇතුලුව ආර්ථික සේවා පිළිබඳ වියදම් වැඩිවීම නිසාය.

**ශුද්ධ ආයෝජන**

ශුද්ධ ආයෝජන පිළිබඳ ඇස්තමේන්තුවක් ලබා ගැනීමේ දී ප්‍රාග් ධන ක්ෂයවීම අඩු කළ යුතුයි. ප්‍රාග් ධන ක්ෂයවීම් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමේ දී බොහෝ අමාරුකම් වලට මුහුණ පාන්නට වේ. පහළ දැක්වෙන ඇස්තමේන්තු වල ස්වාභාවික ධන, හීනය සඳහා ඉඩ සලසා නැත. රජයේ වත්කම්හි ක්ෂයවීම් ප්‍රමාණය 'ආදායමට අය වෙන වියදම යන ගිනුමෙහි ඇතුළත් වන ප්‍රාග් ධන ශීර්ෂයන් හි මුළු වටිනාකමට සමාන යයි සලකා ඇත. නාගරික වාසස්ථානයන් ගේ වටිනාකමේ ක්ෂයවීම එහි වාර්ෂික කුලී ප්‍රමාණයෙන් සියයට 20 කට සමාන යැයි සලකනු ලැබේ. නමුත් ග්‍රාමීය වාසස්ථානවල වටිනාකමේ ක්ෂයවීම් ඇතුළත් කර නැත. ගමනාගමන සහ අනිකුත් උපකරණ පිළිබඳ වටිනාකමේ ක්ෂයවීම් සියයට 9 ක් බව සමාගම්වල ශෙෂ පත්‍ර පරීක්ෂණයකින් හෙළි වීඇත.

**සටහන 1—8**

**පවත්නා වෙළඳ මිල අනුව ප්‍රාග්ධන සම්පාදනය**

| | 1957 | 1958 | 1959 | 1958–1959 වෙනස්වීමේ සියයට ගණන |
|---|---|---|---|---|
| දළ ප්‍රාග් ධන සම්පාදනය ... ... ... ... ... | 697 | 724 | 876 | 20·99 |
| ක්ෂයවීම් ... ... ... ... ... | 210 | 235 | 305 | 29·79 |
| ශුද්ධ ප්‍රාග් ධන සම්පාදනය ... ... ... ... ... | 487 | 489 | 571 | 16·77 |

වෙනත් බොහෝරටවල මෙන් ම ක්ෂයවීම් වටිනාකම සම්බන්ධව මෙහි ඇස්තමේන්තුවල වැරදි නැත්තේ නොවේ. නමුත් ඒ ඇස්තමේන්තු නියම ප්‍රමාණයට අඩුවෙන් සඳහන් වී ඇතැයි සිතිය හැක.

ප්‍රාග් ධන සම්පාදනය ගැන සලකා බලන කල්හි පෞද්ගලික ඉතිරිකිරීම් පිළිබඳව අවක්‍ර සංඛ්‍යා තොරතුරු නොමැත. එ බැවින් ඒ පිළිබඳව ඇස්තමේන්තුවක් සකස් කිරීම ප්‍රයෝජනවත්ය. පහත දැක්වෙන සටහනෙහි ඇස්තමේන්තු පවත්නා මිල ගණන් අනුව සකස් වී ඇත.

**සටහන 1—9**

**පෞද්ගලික ඉතිරිකිරීම්**

| | 1957 | 1958 | 1959 | 1958—1959 වෙනස්වීමේ සියයට ගණන |
|---|---|---|---|---|
| සාධක වියදම් අනුව ජාතික ආදායම (1) ... ... ... ... | 4898 | 5181 | 5372 | 3·69 |
| +රජයෙන් මහජනයාට ලැබෙන සංක්‍රාම ... ... | 288 | 346 | 325 | — 6·07 |
| —මහජනයාගෙන් රජයට ලැබෙන සංක්‍රාම ... ... | 51 | 55 | 60 | 9·09 |
| + ශුද්ධ විදේශීය සංක්‍රාම ... ... ... ... | —66 | —78 | —56 | —28·21 |
| සංඛ්‍යා ඌනතා ... ... ... ... ... | +10 | —17 | +14 | — |
| මුළු පෞද්ගලික ආදායම (2) ... ... ... ... ... | 5079 | 5377 | 5589 | 3·94 |
| —අවක්‍ර බදු හැර ... ... ... ... ... ... | 612 | 606 | 581 | — 4·13 |
| වැය කළ හැකි පෞද්ගලික ආදායම ... ... ... ... | 4467 | 4771 | 5014 | 5·09 |
| පෞද්ගලික පාරිභෝජනය ... ... ... ... ... | 4093 | 4241 | 4451 | 4·95 |
| සම්පූර්ණ වෙළඳ හා පෞද්ගලික ඉතිරිකිරීම් (සාමූහික සහ පෞද්ගලික) | 374 | 530 | 563 | 6·23 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(1) දළ ජාතික නිෂ්පාදිතයේ ක්ෂයවීම් ඉවත් කළ විට, එය සාධක වියදම් අනුවවූ ජාතික ආදායමට සමානය.

(2) පෞද්ගලික ආදායම් ඇස්තමේන්තුවේ අන්තර්ගත ව ඇති සමාගම්වල නොබෙදූ ලාභ නිසා පෞද්ගලික ආදායම් ප්‍රමාණාධිකව ඇස්තමේන්තු කර ඇත. අවක්‍ර අයබදුවලට, සමාගම් ලාභ කෙරෙහි වූ බද්ද ඇතුලත්ය. පෞද්ගලික ව්‍යාපාරයන් විසින් පුද්ගලයින්ට දෙන ලද සංක්‍රාම ඇතුලත් කොට ඇත. මේ අන්දමට ගලපා සකස් කරන ලද ඉතිරිකිරීමේ සංඛ්‍යාවන්ට පුද්ගලික ඉතිරිකිරීම් හා සමාගම්වල නොබෙදූ ලාභ ද ඇතුලත් වෙයි.

## පාරිභෝජනයෙහි, ආයෝජනයන්හි හා නිර්යාතයන්හි අඩංගු ආයාත

පාරිභොජනය සහ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය පාරිභෝජන හා ප්‍රාග් ධන භාණ්ඩ පිට රටින් වැඩි වශයෙන් බලාපොරොත්තු වන ලංකාව වැනි රටක, ධනොපායන මාර්ගයනට ඇතුලත් වන ආයාත ඉතා වැදගත් තැනක් ගනී. පෞද්ගලික සහ මහජන පාරිභෝජනය දළ ප්‍රාග් ධන සම්පාදනය, සහ නිර්යාත සඳහා වූ ආයාත පහත එන සටහනේ දැක්වේ.

### සටහන 1-10

### (1956) ස්ථාවර මිල අනුව වියදම් අංශයන්හි අඩංගු ආයාත

රුපියල් දශ ලක්ෂ

| | 1957 | | | 1958 | | | 1959 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මුළු ගණන | ආයාත අඩංගුව | | මුළු ගණන | ආයාත අඩංගුව | | මුළු ගණන | ආයාත අඩංගුව | |
| | | මුළුගණන | සිය. ගණන | | මුළු ගණ. | සිය. ගණන | | මුළු ගණ. | සිය. ගණන |
| පෞද්ගලික සහ රාජ්‍ය පාරිභොජනය | 4359 | 1625 | 37·28 | 4655 | 1683 | 36·15 | 4903 | 1857 | 37·87 |
| දළ ප්‍රාග් ධන සම්පාදනය | 640 | 206 | 32·19 | 656 | 218 | 33·23 | 774 | 312 | 40·31 |
| භාණ්ඩ සහ සේවා නිර්යාත | 2026 | 114 | 5·63 | 2036 | 162 | 7·96 | 2108 | 178 | 8·44 |
| | 7025 | 1945 | 27·69 | 7347 | 2063 | 28·08 | 7785 | 2347 | 30·15 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

පාරිභොජන වියදමෙහි අඩංගු වන ආයාත 1958 දී සියයට 36. 2 වූ අතර, 1959 දී 37.9 විය. දළ ප්‍රාග් ධන සම්පාදනයෙහි ලා එය සියයට 33.2 සිට 40.3 දක්වා ඉහළ ගියේය. පාරිභොජනයෙහි අඩංගු ආයාතයන් ඉහළ ගියේ ප්‍රධාන වශයෙන් ම අවශ්‍ය ආහාර ආයාත නිසාය. ආයෝජන භාණ්ඩවල අඩංගු ආයාත ඉහළ ගියේ ගොඩනැගිලි කටයුතුවල ශීඝ්‍ර වැඩිවීම සහ ජනසතු කළ ගමනා ගමන සේවාවන්ට අවශ්‍ය උපකරණ ගෙන්වීම නිසාය.

පාරිභෝජනය, ආයෝජනය සහ නිර්යාතයන් අතර දළ ජාතික නිෂ්පාදිතය බෙදී ගිය පිළිවෙල ඒ ඒ මුළු ගණන්වල අඩංගු ආයාතයන් අඩු කිරීමෙන් ලබා ගත හැක. 1—11 වැනි සටහනින් 1956 මිල ගණන්වලට අනුව දළ ජාතික නිෂ්පාදිත ඒ ඒ දේ අතර බෙදුන හැටි හෙළි කරයි.

### සටහන 1—11

### 1956 මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය වියදම් අනුව බෙදෙන පිළිවෙළ

රුපියල් දශ ලක්ෂ

| | 1957 | | 1958 | | 1959 | |
|---|---|---|---|---|---|---|
| | මුළු ගණන | සියයට ගණන | මුළු ගණන | සියයට ගණන | මුළු ගණන | සියයට ගණන |
| පෞද්ගලික සහ රාජ්‍ය පාරිභොජනය | 2734 | 53·82 | 2972 | 56·25 | 3046 | 56·01 |
| ප්‍රාග් ධන සම්පාදනය ... ... | 434 | 8·54 | 438 | 8·29 | 462 | 8·50 |
| භාණ්ඩ හා සේවා නිර්යාත ... | 1912 | 37·64 | 1874 | 35·46 | 1930 | 35·49 |
| | 5080 | 100·00 | 5284 | 100·00 | 5438 | 100·00 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

### සැපයුම සහ වියදම්

''වියදම්'''(හෝ පාවිච්චි කළ ධනය) බෙදී යාමේ වෙනස්වීම් සහ ''සැපයුම්'' (ප්‍රයෝජනයට ලැබුණ ධනය) සම්පාදිත ආකාරය පහත සටහනින් දැක්වේ.

**සටහන 1—12**

**වියදම් හා සැපයුම් වෙනස්වීමේ සියයට ගණන**

| | පවත්නා සාධක වියදම් මිල අනුව | | ස්ථාවර සාධක වියදම් මිල අනුව | |
|---|---|---|---|---|
| | 1957 න් 1958 ට | 1958 න් 1959 ට | 1957 න් 1958 ට | 1958 න් 1959 ට |
| **වියදම.** | | | | |
| පෞද්ගලික පාරිභෝජනය ... ... ... | + 3·8 | + 5·1 | + 5·6 | + 5·2 |
| රාජ්‍ය පරිභෝජනය ... ... | +15·4 | + 6·4 | +13·1 | + 6·2 |
| දළ පෞද්ගලික ප්‍රාග් ධන සම්පාදනය ... ... | — 3·4 | +16·9 | — 6·5 | +20·1 |
| දළ රාජ්‍ය ප්‍රග් ධන සම්පාදනය ... ... | + 9·1 | +18·2 | —10·1 | +16·5 |
| භාණ්ඩ සහ සේවා නිර්යාත ... ... | — 2·1 | + 8·1 | + 0·5 | + 3·5 |
| **සැපයුම්.** | | | | |
| දළ දේශීය නිෂ්පාදනය ... ... | + 5·9 | + 4·7 | + 4·0 | + 3·6 |
| භාණ්ඩ සහ සේවා ආයාත ... ... | — 1·8 | +12·6 | + 6·1 | +13·8 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1959 දී සැපයුම් හෝ ප්‍රයෝජනයට ලැබුණ ධනයෙහි මුළු වැඩිවීම, මූර්ත ලෙස සලකා බැලීමේ දී රුපියල් කෝටි 43.8 ක් වෙයි. මේ වැඩිවීමේ දී දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය සියයට 35 කට ආසන්න වූ අතර ආයාත පරිමාව සියයට 65 ක් වැඩි විය. වියදම් අංශයෙහි වැඩි වූ ධනයෙන් සියයට 11 ක් මහජන පාරිභොජනය සඳහා ද සියයට 27 ක් දළ ආයෝජන උදෙසා ද සියයට 16 ක් භාණ්ඩ සහ සේවා නිර්යාත ප්‍රසාරණය සඳහා ද යොදා ඇත.

### එක් අයෙකු අනුව ප්‍රමාණයෙහි වෙනස් වීම.

වර්ෂ මධ්‍යයේ දී කරන ලද ඇස්තමේන්තු අනුව, දශලක්ෂ 9.64 ක් වූ 1959 ජනගහනය පසු ගිය අවුරුද්දට වඩා සියයට 2.5 කින් වැඩි විය. පවත්නා මිල අනුව, එක් අයෙකුගේ නිෂ්පාදිත ප්‍රමාණය 1959 දී රුපියල් 589 කි. මෙය 1958ට වඩා සියයට 2.3 කින් වැඩිය. ජාතික නිෂ්පාදිතයේ ප්‍රධාන අංශයන්හි එක් අයෙකු අනුව වූ මූර්ත වෙනස්වීම් පහල සටහනේ දැක්වේ.

**සටහන 1—13**

**දළ ජාතික නිෂ්පාදිතයේ එක් අයෙකු අනුව වෙනස් වීම**
**(1956 මිල ගණන් අනුව)**

| දර්ශකයන් | 1958 | 1959 |
|---|---|---|
| 1. ජනගහනය ... ... ... ... ... ... ... ... | 105·1 | 107·7 |
| 2. එක් අයෙකු අනුව පෞද්ගලික පාරිභොජනය... ... ... ... ... | 105·8 | 108·5 |
| 3. එක් අයෙකු අනුව දළ ප්‍රාග් ධන සම්පාදනය ... ... ... ... ... | 90·1 | 103·7 |
| 4. එක් අයෙකු අනුව භාණ්ඩ සහ සේවා නිර්යාත ... ... ... ... | 95·2 | 96·2 |
| 5. එක් අයෙකු අනුව භාණ්ඩ සහ සේවා ආයාත ... ... ... ... | 106·2 | 118·0 |
| 6. එක් අයෙකු අනුව නිමැවුම ... ... ... ... ... .. | 99·8 | 101·1 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

Central Bank of Sri Lanka
22449
21 APR 2009

1959 දී එක් අයෙකුගේ නිමැවුම් ප්‍රමාණය වැඩිවීමේ ශීඝ්‍රතාව සියයට 1.3 ක් වූ අතර 1958 දී එය සියයට 1.4 ක් විය. නිර්යාත ප්‍රසාරණයෙහි මඳ ඉහළ යාමක් ඇති විය. එක් අයෙකු අනුව වූ පාරිභෝජන ප්‍රමාණය සියයට 2.6 දක්වා ඉහළ ගියේය. නමුත් මෙයින් කිසි ආදයම් කණ්ඩායමක නියම පාරිභෝජන පිළිවෙල මැනෙන්නේ නොවේ. එක් අයෙකු අනුව ආයාත සියයට 11.1කින් ඉහළ ගිය අතර , දළ ප්‍රාග් ධන සම්පාදනය ගිය අවුරුද්දට වඩා විශෙෂ වැඩිවීමක් දක්වමින් සියයට 15 කින් ඉහළ ගියේ ය.

මුර්ත නිමැවුම වැඩිවීමේ ශීඝ්‍රතාව සියයට 1.3 වීම, ආර්ථික සංවර්ධනය පතන ලංකාව වැනි නොදියුණු රටකට දුබල වේගයක් ලෙස සැලකෙයි.

## (ඇ) විදේශීය වෙළඳාම

### 1. සම්පූර්ණ තත්වය.

1959 දී ලංකාවේ විදේශීය වෙළඳාමෙහි වැඩි දුර ප්‍රසාරණයක් දක්නට ලැබිණ. මෙය මෙතෙක් නොවූ වාර්තාවක් පිහිටුවමින් රුපියල් කෝටි 375.9ට නැංගේය. එසේ වුව ද වෙළඳාම් වටිනාකමෙහි වැඩිවීම නිර්යාත හා ආයාත අතර බෙදී ගොස් ඇත්තේ ඉතා අසමාන අන්දමිනි. නිර්යාතයන්ගේ වටිනාකම රුපියල් කෝටි 175·4කින් වැඩි වූ අතර ආයාතයන්ගේ වටිනාකම රුපියල් කෝටි 200·5 කින් ඉහළ නැංගේය. (පසුගිය දශකයේ වෙළඳ සාමාන්‍යයන් හා සසඳා බලන විට නිර්යාත සියයට 7කින් ද ආයාත සියයට 33කින් ද වැඩි වී ඇත.) මෙහි ප්‍රතිඵලය වූයේ රුපියල් කෝටි 25·1ක වෙළඳ අවාසියක් ඇති වීමය. මේ වාර්තාගත වී ඇති විශාලම හිඟයයි.

ආයාත අංශයෙහි මේ සීඝ්‍ර නැඟීමට හේතු වූයේ සම්පූර්ණ ආයාත පරිමාවෙහි වැඩි වීමය. ශ්‍රී ලංකා මහ බැංකු වෙළඳ දර්ශකයෙන් පෙනී යන අන්දමට ආයාත පරිමාව සියයට 12කින් ඉහළ නැංගේය. ආයාතයන්ගේ සාමාන්‍ය මිල මට්ටම සියයට 1කින් පහළ වැටුණි. සහල් පිටි ආදී සමහර ආයාතයන්ගේ වැඩිවීම රජයේ ආහාර ද්‍රව්‍ය ගබඩා කර ගැනීමේ ප්‍රතිපත්තිය නිසා සිදු වූවකි. සිමෙන්ති, පොර වර්ග ආදී අනිකුත් ද්‍රව්‍යයන්ගේ වැඩිවීම වූයේ ගිය අවුරුද්දේ කොළඹ වරායේ ඇති වූ දුෂ්කරතාවන් නිසා, අනියම් ලෙස පහත බැස ගිය ද්‍රව්‍ය තොග, නැවත ගබඩා කිරීම නිසාය. තව ද ගමනාගමනය දියුණු කිරීම හා අලුත් වැඩියා කිරීමේ හේතුන් නිසා සමහර වර්ගයන්ගේ ගමනාගමන උපකරණ සහ වෙනත් උපකරණවල ආයාතයද වැඩි විය. පාරිභෝජන භාණ්ඩ ආයාතයන්ගේ ද සැළකිය යුතු වැඩිවීමක් ඇති විය. මෙය එක් අතකින් රජයේ වියදම් නිසා ප්‍රසාරණය වූ ආදයම් තත්ත්වයෙන් උද්ගත වූවකි. මේ කරුණු පහත සාකච්ඡා කෙරේ. 1959 දී මුළු ප්‍රාග් ධන භාණ්ඩ පරිමාව සියයට 35කින් වැඩි වූයේ ආයාත මධ්‍යස්ථ ප්‍රමාණයකට වැඩි වූ කාලයකට පසුවය. 1959 න් අවසාන වූ පස් අවුරුදු කාලය තුල, වැඩිවීමේ සාමාන්‍ය වාර්ෂික ශීඝ්‍රතාව සියයට 8·8ක් විය. 1959 සිදු වූ ප්‍රාග් ධන භාණ්ඩ ආයාතයන්හි ශීඝ්‍ර වැඩිවීමෙන්, පසුගිය වර්ෂයන්හි සුළු අන්දමින් වූ වැඩිවීම් පිරිමැසුණේය.

1959, රුපියල් කෝටි 28·8කින් ආයාතයන්ගේ වටිනාකම වැඩි වූ අතර නිර්යාතයන්ගේ වටිනාකම වැඩි වූයේ රුපියල් කෝටි 4·3කින් පමණෙකි.

1959 ලංකාවේ නිර්යාත වටිනාකම සියයට 3කින් වැඩි වූ අතර අනිත් හැම කාර්මික රටකම වාගේ මෙයට වඩා දියුණුවක් වාර්තා වී ඇත. කාර්මික රටවල, ආර්ථික තත්ත්වය වාර්තා පිහිටුවන ප්‍රමාණයට ඉහළ ගිය වර්ෂයක, ලංකාවේ නිර්යාතයන්ගේ වටිනාකම ඊට අනුරූපව ඉහළ නොයාමට හේතු විමසීම අවශ්‍යය.

1958–59 දී මූලික නිෂ්පාදිතයන්ගේ ලෝක ඉල්ලුම්–සැපයුම් තත්ත්වයේ ශීඝ්‍ර වෙනස්වීම්, ලංකාවේ ප්‍රධාන නිර්යාතයන්ට ලැබුණ මිල ගණන්වලින් පිළිබිඹු වෙයි. නිර්යාතයන්ගේ සාමාන්‍ය මිල 1959 දී සියයට 4කින් ඉහළ නැංගේය. 1958 වේ මිල මට්ටමට වඩා සියයට 16 කින් රබර් මිල ඉහළ ගිය අතර, පොල් නිෂ්පාදිතයන්ගේ මිල සියයට 18කින්, අවුරුදු අටකින් ලැබුණු ඉහළ මට්ටමට නැංගේය. නමුත් තේවල නැව් මිල සියයට එකකින් පහළ බැස්සේය.

1959 වර්ෂයේ ප්‍රධාන නිර්යාතයන්ගේ මිල පිළිබඳ වූ අසමාන තත්ත්වය, පරිමාව සම්බන්ධයෙන් ද බල පැවේය. පොල් නිෂ්පාදිත නිර්යාත පරිමාවෙන්, සියයට 24ක් ඉහළ නැංග අතර, රබර් පරිමාව 1958 මට්ටමෙහි පවත්වා ගැනීම පවා අසීරු විය. එහි පරිමාව මදකින් පහත බැස්සේය. 1959 තේ නිර්යාත, පරිමාවෙන් පමණක් නොව මිලෙන් ද අසතුටුදායක විය. තේ නිර්යාත පරිමාව සියයට 6කින් පහත වැටුණ අතර, එහි වටිනාකම රුපියල් කෝටි 8·6 කින් අඩු විය.

විදේශීය මුදල් වැඩි වශයෙන් උපයනු ලබන්නේ තේ කර්මාන්තයෙනි. පිටරටින් ලැබෙන ආදායමෙන් පහෙන් තුනක් ම ලැබෙනුයේ තේවලිනි. නමුත් ජාත්‍යන්තර වෙළඳාමට ඇතුලත් වන අනිකුත් මූලික ද්‍රව්‍ය බොහොමයක් කෙරෙහි මෙන්, දියුණු කාර්මික රටවල චක්‍රීය වෙනස් වීම්, තේ කෙරෙහි එතරම් බල නොපායි. නිර්යාත අතර ප්‍රධාන ස්ථානයක් ගන්නා හෙයින් ද, එයට ඇති වෙළඳ ඉල්ලුමෙහි අනම්‍යතාවය නිසා ද, කාර්මික රටවල ක්‍රියාකාරිත්වයේ පහල වැටීමෙන් (නිර්යාතයන්ගේ මිල පහළ බැසීමෙන්) උද්ගත වන අවාසි තත්ත්වයෙන් ලංකාවේ නිර්යාත ස්ථාවරත්වය ආරක්ෂා කර ගැනීමෙහි ලා තේ, උපකාරී වෙයි. එසේම 1959 අත්දැකීම්වලින් පෙන්නුම් කරන පරිදි පිටරට කාර්මික කටයුතුවල පුනර්ජීවයකින් ඇති විය හැකි නිර්යාත ලැබීමෙහි සැළකිය යුතු වැඩිවීම ද, මෙයින් බලවත් ලෙස සීමා කෙරේ.

විදේශීය වෙළඳ අනුපාතයෙන් මේ ආයාත නිර්යාත මිල පිළිබඳ විවිධ චලනයන් පිළිබිඹු වේ. 1959 ආයාත මිල මට්ටම සියයට 1කින් පහළ බැසීමෙන් නිර්යාත මිල මට්ටමෙහි ඇති වූ දියුණුව නිසා විදේශීය වෙළඳ අනුපාතයෙහි අමුතු වාසියක් ඇති විය. මහ බැංකු වෙළඳ දර්ශකයෙන් පෙන්වන පරිදි විදේශීය වෙළඳ අනුපාතය සියයට 5කින් ඉහළ නැංගේය. 1959 දී ඒ විශාල වෙළඳ අවාසිය ඇති වූයේ විදේශීය වෙළඳ අනුපාතයෙහි මෙ වැනි වාසියක් ඇතිව තිබිය දීය.

## 2. නිර්යාත

වටිනාකම, පරිමාව සහ මිල පිළිබඳ සංඛ්‍යා 2 වන පරිශිෂ්ටයේ 27 සිට 31 දක්වා වූ සංඛ්‍යා සටහන්වල දක්වා ඇත.

### තේ.

1959 යේ සම්පූර්ණ තේ නිෂ්පාදනය රාත්තල් කෝටි 41·3ක් විය. මෙය, වාර්තාවක් පිහිටු වූ 1958 නිෂ්පාදනයට සමාන වුව ද, පිට රට පැටවූ රාත්තල් ගණන කෝටි 2·7කින් පහළ බැස්සේය. ඊට පෙර අවුරුදු දෙකෙහිම නිෂ්පාදනයෙන් සියයට 6ක් ව පැවති දේශීය තේ පාරිභෝජනය 1959 දී සැළකිය යුතු ලෙස වෙනස් වූයේ යයි සිතිය නො හැක. එබැවින් නිර්යාතයන්ගේ ඇති වූ ඌනතාව, ලබන වර්ෂයේ මුල් භාගයේ පියවෙන්ට ඉඩ තිබේ.

මෙතෙක් ලැබී ඇති සංඛ්‍යා තොරතුරු අනුව 1959 දී ලෝක තේ නිෂ්පාදනය මදක් පහළ බැස තුබූ බැව් හෙළි වෙයි. ලෝක තේ නිර්යාතයන් මීටත් වඩා පහළ බැස ඇත. ලන්ඩන් තේ වෙන්දේසියේ සියලුම වර්ගවල වාර්ෂික සාමාන්‍ය තේ මිල, 1959 දී ශත 3කින් රු. 3·03ට අඩු වුව ද, ලංකා තේ මිල ශත 9කින් රුපියල් 3·38ට වැඩි විය. මේ සමඟම ලෝක තේ ආයාතයන්ගෙන් සියයට 49ක් පමණ ගෙන්වන එක්සත් රාජධානියේ තේ ආයාතය රාත්තල් කෝටි 7·0 පහළ වැටුණේය. ලංකාවෙන් ගෙන්වූ තේ ප්‍රමාණය රාත්තල් කෝටි 2.34කින් ද, ඉන්දියාවෙන් ගෙන්වූ තේ ප්‍රමාණය තේ රාත්තල් කෝටි 4·16[1]කින් ද අඩු විය. එක්සත් රාජ්‍යයට ගෙන්වන තේ පරිමාවෙහි උච්චාවචන ඇතිවීම එතරම් විරළ නොවේ. නමුත් 1959 තේ ආයාතයෙහි පහළ වැටීම එරටෙහි තේ පාරිභෝජනයෙහි නිත්‍ය අඩුවීමක් ලෙස සැලකීමට තරම් ලකුණු නැත.

කොළඹ තේ වෙන්දේසියේ දී, සියලුම තේ වර්ගයන්හි වාර්ෂික මිල 1959 දී රාත්තලකට ශත 12කින් වැඩි විය. ප්‍රධාන වශයෙන්, මේ වැඩිවීම 1959 ජුනි පළමු වැනිදා[2] තේ නිර්යාතයන්ගේ තීරු බද්ද සංශොධනය කිරීමේ ප්‍රතිඵලය විය. මේ සංශොධනයෙන් බාල තේ වර්ග විශාල ගණනක බද්ද ශත 35කින් පමණ අඩු වූ බැවින් ඒවායේ වෙළඳ මිල වැඩි විය. කලින් සඳහන් කළ පරිදි, 1959 දී නැව් මිල මදකින් අඩු විය.

---

1 එක්සත් රාජ්‍යයේ රේගු හා—ආදායම්—බදු සංඛ්‍යාවලින් උපුටා ගන්නා ලදි.

2 සංශොධනය කළ තේ බදු ක්‍රමය පහත සඳහන් රජයේ මුදල් පරිහරණය යන ඡේදයේ විස්තර වේ.

## සටහන 1—14

### තේ නිර්යාත ප්‍රමාණයන් සහ මිල

| වර්ෂය | නිර්යාත | | රාත්තලක කොළඹ වෙන්දේසි මිල (සාමාන්‍යය) | | | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රා. දශ ලක්ෂ | නැව් මිල රාත්තලකට රු. ශත | උස්බිම් වගාව රු. ශත | මැදිබිම් වගාව රු. ශත | පහත්බිම් වගාව රු. ශත | සියලුම තේ වර්ග රු. ශත |
| 1955 .. .. | 362 | 3.30 | 2.34 | 2.04 | 2.40 | 2.24 |
| 1956 .. .. | 348 | 3.00 | 2.50 | 1.96 | 1.88 | 2.16 |
| 1957 .. .. | 368 | 2.78 | 2.05 | 1.61 | 1.88 | 1.86 |
| 1958 .. .. | 411 | 2.75 | 2.11 | 1.51 | 1.48 | 1.73 |
| 1959 .. .. | 384 | 2.72 | 2.13 | 1.69 | 1.67 | 1.85 |

සංඛ්‍යා තොරතුරු—ලංකා රේගු වාර්තාවලින් හා කොළඹ තේ වෙන්දේසි කරුවන්ගේ සංගමයෙනි

### රබර්

1959, රබර් නිෂ්පාදකයින්ට සතුටුදායක අවුරුද්දක් විය. 1956 සිට නොකඩවා පහළ බසිමින් තුබුණු රබර් මිල 1958 අග හරියේදී ඉහළ අතට හැරී ඉතා එලදායී මිල මට්ටමකට නැංගේ ය. එක්සත් ජනපදයේත් එක්සත් රාජධානියේත්, බටහිර යුරෝපයේ සහ ජපානයේත් ඇති වූ කාර්මික කටයුතුවල ප්‍රසාරණයෙන් මේ මිල නැගීම සීඝ්‍ර විය. නැගෙනහිර යුරෝපීය රටවල සහ චීනයේ ඉල්ලීම් වැඩි වීමද, මෙයට උපකාරී විය.

එක්සත් ජනපදය හා එක්සත් රාජධානිය වැනි පාරිභෝජන රටවල තුබූ රබර් තොග මුදා හැරීමේ ප්‍රකාශයෙන් හා ඊට පසු මුදා හැරීමෙන්, කෙමෙන් නගිමින් තිබූ රබර් මිල, මැයි හා ඔක්තෝබර් මාසයන්හි, තාවකාලික වශයෙන් ඇණහිටිණි. වාර්ෂයාවසානයේ එක්සත් සමාජ වාදී සෝවියට් සමූහාණ්ඩුවේ රබර් තොග මුදා හැරීමේ ප්‍රකාශනය, නැවතත් රබර් මිල කෙරෙහි බල පෑ නමුත් අවුරුද්ද මුලදීට වඩා රබර් මිල වැඩිව තිබිණ.

මිල වැඩි වුව ද, සැපයුම වැඩි වූයේ ඉතා සෙමිනි. රබර් වගාවෙන් වැඩි කොටසක් ඇතුලත් වන විශාල වතුවල, මිල අධික වුව ද, ගස්වලට හානි වන අන්දමට කිරි කැපීම නො කෙරේ. 1959 ලෝකයේ ස්වාභාවික රබර් පාරිභෝජනය සියයට 6කට කිට්ටු ගණනකින් වැඩි වුව ද, නිෂ්පාදනය වැඩි වූයේ සියයට 5කින් පමණෙකි.

1959 දී රබර්වලට ඉතා වාසි සහගත මිලක් ලැබුන ද ලංකාවේ නිෂ්පාදන පරිමාව සියයට අටකින් පහළ බැස්සේය. මෙය ඊට පෙර අවුරුදු පහ තුල වූ මට්ටමට වඩා බොහෝ සෙයින් අඩුය. අවුරුදු කීපයකට පෙර විශාල ලෙස අරඹන ලද නැවත වගා කිරීමේ කටයුතු ද, අයහපත් කාල ගුණය ද, මෙයට හේතු විය. 1959 දී ලංකාවේ රබර් නිර්යාතයන්ගේ පරිමාව සියයට 1කින් රාත්තල් කෝටි 20·6කට පහල බැස්සේය.

1958 රු. 1·25 වූ, රබර් රාත්තලක නැව් මිල 1959 අගෝස්තු මාසයේ දී රු. 1·51ට වැඩි විය. රබර් නිර්යාත පරිමාවෙහි මද අඩුවෙක් ඇති වුව ද, සාමාන්‍ය මිලෙහි වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1959 දී රබර් නිර්යාත වටිනාකම සියයට 16කින් (හෙවත් රුපියල් කෝටි 4කින්) රුපියල් කෝටි 29·8ට වැඩි විය.

මිලෙහි දියුණුවත් සමගම නිර්යාත බද්ද වැඩිකරන ලදී. 1958 දීරාත්තලකට ශත 20ක් වූ නිර්යාත බද්ද 1959 සැප්තැම්බර් 10 වැනිදා සිට ශත 28 කරන ලදි. 1959 නොවැම්බර් 6 වැනිදා ක්‍රේප් රබර් කිරි රාත්තලක බද්ද පමණක් ශත 38 කරන ලදි. ඉන් සතියකට පසු සියලුම රබර් වර්ග සඳහා බදු එක සමානව ශත 38 කරන ලදි. ක්‍රමයෙන් වැඩි කල නිර්යාත බද්දෙන් බලාපොරොත්තු වූයේ මිල ඉහළ යාමේ හේතුයෙන් නිෂ්පාදකයන්ට ලැබුන වැඩි ලාභයෙන් කොටසක් ආණ්ඩුවේ ආදායමට ඇද ගැනීමය.

**පොල් නිෂ්පාදිත.**

පොල් නිෂ්පාදිත සැපයුමෙහි පොදු හිඟයක් ද, පොල්වලට ලෝකයෙහි බලවත් ඉල්ලුමක් ද, ඇතිවීම 1959 අවුරුද්දේ විශේෂ ලක්ෂණය විය. 1958 දී අයහපත් කාල ගුණය නිසා සැළකිය යුතු ප්‍රමාණයෙකින් පහත බැස තිබුණ පොල් නිෂ්පාදනය 1959 දී තව දුරටත් පහළ බැස්සේය. නමුත් ඉල්ලුම අධික වෙමින් පැවතිණ. ලංකා පොල් තෙල් සඳහා ලන්ඩනයේ පැවති ඉහළ මිල මට්ටමෙන් මෙය මනාව පිළිබිඹු වෙයි. 1959 ජනවාරි මාසයේ දී රුපියල් 1763ක් වූ, තෙල් ටොන් එකක රක්ෂණය හා නැව් කුලී සහිත මිල, එම වර්ෂයේ දෙසැම්බර් මාසය වන විට රු. 1813 දක්වා ඉහළ නැග තිබිණ. 1959 මුල් භාගයේ දී ශීඝ්‍රයෙන් ඉහළ යමින් පැවතුණ තෙල් මිල එක්සත් රාජධානියේ රැස් කොට තිබූ පොල් තෙල් තොගයේ කොටසක් මුදා හැරීමේ ප්‍රකාශයේ ප්‍රතිඵලයක් වශයෙන් ජූනි මාසයේ දී පහළ වැටුනේ ය. ලෝක සැපයුම් තත්ත්වයෙහි නො කඩවා පැවති හිඟය ද, වැඩිවෙමින් පැවති ඉල්ලුම් තත්ත්වය ද, 1959 යේ අවසාන භාගයේ පොල් නිෂ්පාදිතයන්ගේ මිල ඉහළ මට්ටමක පවත්වා ගෙන යාමට ඉවහල් විය.

මහ බැංකු වෙළඳ දර්ශකයෙන් පෙනී යන පරිදි, ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනෙහි (කොප්පරා, පොල් තෙල්, කපාපු පොල්වල) සාමාන්‍ය නිර්යාත මිල 1958 මිල හා සැසඳීමේ දී සියයට 18කින් ඉහළ නැග ඇත. 1959 පොල් නිෂ්පාදිතයන්ගේ මුළු නිර්යාත පරිමාව, තෙල් ප්‍රමාණයෙන් සමාන කර බැලීමේ දී, 1958 දී එක්ලක්ෂ දහදහක් වූ අතර, 1959 දී ටොන් එක් ලක්ෂ හතළිස් දහක් විය. මිලෙහි සහ පරිමාවෙහි ඇති වූ දියුණුව නිසා පොල් නිර්යාතයන්හි වටිනාකම 1959 දී රු. කෝටි 8 කින් රුපියල් කෝටි 24·4 දක්වා ඉහළ නැංගේය. ලංකාවේ පොල් නිෂ්පාදනය පිළිබඳ සම්පූර්ණ සංඛ්‍යා නොමැත. එහෙත් ඉහතින් දැක්වෙන ජාතික නිෂ්පාදිතය හා ආදයම යන පරිච්ඡෙදයේ මේ සම්බන්ධව ඇස්තමේන්තු ඇතුලත් කොට ඇත.

**සටහන 1 — 15**

**ප්‍රධාන පොල් නිෂ්පාදිත — නිර්යාත ප්‍රමාණයන් සහ මිල**

| නිෂ්පාදිතය | 1956 | | 1957 | | 1958 | | 1959 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය හොණ්ඩර දහස් ගණනින් | හොණ්ඩර යක නැව් මිල | ප්‍රමාණය හොණ්ඩර දහස් ගණනින් | හොණ්ඩර යක නැව් මිල | ප්‍රමාණය හොණ්ඩර දහස් ගණනින් | හොණ්ඩර යක නැව් මිල | ප්‍රමාණය හොණ්ඩර දහස් ගණනින් | හොණ්ඩර යක නැව් මිල |
| කොප්පරා .. .. | 1,155 | 42.43 | 695 | 47.95 | 554 | 52.97 | 852 | 60.52 |
| පොල් තෙල් .. | 1,698 | 58.42 | 1,081 | 62.80 | 887 | 69.80 | 1,389 | 84.41 |
| කපාපු පොල් .. | 1,275 | 50.86 | 978 | 56.08 | 1,135 | 63.72 | 1,050 | 71.45 |

ලංකා රේගු වාර්තා අනුවයි.

සංලක්ෂ්‍යය:—පොල් නිෂ්පාදිතයන්ගේ නැව් මිල වැඩිවීමත් සමග ම, අවුරුදු හතරක් පමණ කාලයක් නොවෙනස්ව පැවතුණ, කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් සඳහා වූ තීරු බදු, 1959 ජුලි 10 වැනිද සිට ටොන් එකකට රු. 245, රු. 185, රු. 135 දක්වා අනුපිළිවෙලින් වැඩි විය.

**3ඃ ආයාත.**

කලින් දැක් වූ ඡෙදයන්ගෙන් 1959 ආයාතයන්ගේ වටිනාකම හා පරිමාව වැඩිවීම, පිළිබඳ සැළකිල්ල යොමු කරන ලදී. ආයාතයන්ගේ සැකසුම පහළ සටහනෙහි දක්වා ඇත.

## සටහන 1—16

### ආයාත සැකසුම.

| | වටිනාකම රුපියල් දශ ලක්ෂවලින් | | | මුළු ආයාතයන්ගේ සියයට ගණන | | |
|---|---|---|---|---|---|---|
| | 1957 | 1958 | 1959 | 1957 | 1958 | 1959 |
| **ආහාර පාන සහ දුම්කොළ** | 736 | 715 | 812 | 40.8 | 41.6 | 40.5 |
| මෙයින්:— | | | | | | |
| හාල් .. .. | 255 | 238 | 283 | 14.1 | 13.9 | 14.1 |
| පිටි .. .. | 86 | 67 | 106 | 4.8 | 3.9 | 5.3 |
| සීනි .. .. | 82 | 87 | 75 | 4.5 | 5.1 | 3.8 |
| කිරි නිෂ්පාදිත .. .. | 63 | 58 | 83 | 3.5 | 3.4 | 4.1 |
| මත්ස්‍ය නිෂ්පාදිත .. | 80 | 92 | 89 | 4.4 | 5.4 | 4.4 |
| කුළු බඩු .. | 41 | 35 | 39 | 2.3 | 2.0 | 1.9 |
| **අමු ද්‍රව්‍ය සහ කාර්මික භාණ්ඩ** .. .. | 1068 | 1002 | 1193 | 59.2 | 58.4 | 59.5 |
| පැට්රල් නිෂ්පාදිත | 202 | 125 | 134 | 11.2 | 7.3 | 6.7 |
| පෝර වර්ග .. .. | 70 | 47 | 61 | 3.9 | 2.7 | 3.0 |
| සිමෙන්ති .. .. | 28 | 13 | 22 | 1.6 | 0.8 | 1.1 |
| යකඩ සහ වානේ .. | 70 | 68 | 85 | 3.9 | 4.0 | 4.2 |
| යන්ත්‍රෝපකරණ .. | 81 | 89 | 107 | 4.5 | 5.2 | 5.3 |
| රෙදි පිළි .. .. | 147 | 160 | 147 | 8.1 | 9.3 | 7.3 |
| රසායන ද්‍රව්‍ය—ඖෂධ, සායම් සහ පාට වර්ග | 42 | 42 | 56 | 2.3 | 2.4 | 2.8 |
| කඩදසි සහ කාඩ්බෝඩ් | 34 | 29 | 34 | 1.9 | 1.7 | 1.7 |
| ගමනාගමන උපකරණ මෝටර් කාර් .. | 34 | 36 | 50 | 1.9 | 2.1 | 2.5 |
| වෙනත් ගමනාගමන උපකරණ .. | 54 | 71 | 127 | 3.0 | 4.1 | 6.3 |
| මුළු ආයාත .. | 1804 | 1717 | 2005 | 100.0 | 100.0 | 100.0 |

ලංකා රේගු වාර්තා අනුවයි.

මහ බැංකු වෙළඳ දර්ශකයට ඇතුලත් වන මුළු ආයාතයන්ගෙන් හතරෙන් තුනක් වන පාරිභෝජක භාණ්ඩ වැඩි වී ඇත්තේ මධ්‍යස්ථ වශයෙනි. එනම් සියයට 6කිනි. ඉතිරි ප්‍රමාණය වූ හතරෙන් එකක් වන ප්‍රාග් ධන භාණ්ඩ පරිමාව සියයට 35කින් වාර්තා වී ඇති ඉහළ ම මට්ටමට නැංගේය.

විශේෂයෙන් රෙදිපිළි හැර, අනිකුත් විවිධ පාරිභෝජක භාණ්ඩයන්ගේ ආයාතය වැඩි විය. ආයාතය වැඩි වූ භාණ්ඩ සමහරක් නම් හාල් (කෝටි 4·5), පිටි (රුපියල් කෝටි 3·9), කිරි ආහාර (රුපියල් කෝටි 2·5), වෙනත් පාරිභෝජන භාණ්ඩ.* (රුපියල් කෝටි2·7), ඉහත සඳහන් කළ පරිදි, හාල් සහ පිටි ආයාතයන්ගේ ඉහළ නැගීම වූයේ රජය විසින් විශාල තොග රැස්කර තැබීමේ ප්‍රතිපත්තිය නිසාය. රෙදිපිළි ආයාතය පහළ වැටුනේ කාර්මික නිෂ්පාදිත පණත හේතුවෙනි. මේ පණතේ විධිවිධානයන් යටතේ දේශීය රෙදිපිළි නියමිත ප්‍රමාණයක් මිලයට නොගෙන යම් යම් වර්ගවල රෙදිපිළි පිට රටින් ගෙන්විය නොහැකිය.

ප්‍රාග් ධන භාණ්ඩ ගණයට ඇතුලත් වන භාණ්ඩ අතර විශාල ලෙස ඉහළ ගොස් ඇත්තේ ගමනාගමන උපකරණ (මෝටර් කාර් හැර) ආයාතයන්ය. මෙය 1959 දී රුපියල් කෝටි 5.6 කින් නැංගේය. දුම්රිය උපකරණ (රුපියල් කෝටි 1·3), මෝටර් බස් සහ අමතරකොටස් (රුපියල් කෝටි 1·9), බෝට්ටු හා බත්තල් (රු. කෝටි 1·6), යන දෑ වැඩි වූ ආයාත අතර විය. පෝර, සිමෙන්ති, යකඩ සහ වානේ ආයාතයන් ඉහළ ගියේ පසුගිය අවුරුද්දේ මේ ද්‍රව්‍යයන්හි ආයාත හිහය තරමක් දුරට පිරිමැසීමක් වශයෙනි. (විදුලි යන්ත්‍රොපකරණ හැර) යන්ත්‍රොපකරණ ආයාතය කෝටි 2කින් ඉහළ ගියේ ය.

* මෙහි පහත දක්වෙන දෑ ද ඇතුලත් වේ.;– පැට්රල්, භූමිතෙල්, මෝටර් කාර්, පාවහන්, සිනමා චිත්‍ර පටි, කුඩ, ගෘහ සීතකරණ, අත්ඔර්ලෝසු සහ අනිකුත් ඔර්ලෝසුත්ය.

## 4. වෙළඳාම් සැකසුම — මුදල් කලාප හා ප්‍රදේශ වශයෙන්

ප්‍රධාන මුදල් කලාප සහ ප්‍රදේශ වශයෙන් වෙළඳාම පැවති ආකාරය 2 වන පරිශිෂ්ටයේ 31 වන සටහනින් දක්වෙයි.

ලංකාවේ විදේශීය වෙළඳාමෙන් භාගයකටත් වඩා **රන් පවුම්** කලාපය සමඟ වේ. 1959 දී රන් පවුම් කලාපය වෙත වූ නිර්යාතයන්ගේ පහළ බැසීම පසුගිය අවුරුදු හා සසඳන විට කැපී පෙණින. වටිනාකම අනුව රුපියල් කෝටි 5·7කින් එනම් සියයට 6කින් නිර්යාත පහළ වැටිණ. එක්සත් රාජධානියට යැවූ නිර්යාත රුපියල් කෝටි 8·5 කින්ම අඩුවිය. මෙසේ වූයේ එක්සත් රාජධානිය, තේ, රබර් හා කපාපු පොල් අඩු වශයෙන් මිලයට ගැනීමෙනි. නමුත් ලංකාව රන්පවුම් කලාපයෙන් ලබා ගත් ආයාතයන්ගේ වටිනාකම සියයට 23කින් පමණ වැඩි විය. මීට හේතු වූයේ ආහාර (විශේෂයෙන් සහල් සහ පිටි) පැට්‍රල්, රසායනික ද්‍රව්‍ය, රථවාහන, යකඩ සහ වානේ විශාල ලෙස මිලයට ගැනීමය. රන් පවුම් කලාප ආයාත, වටිනාකමෙන් සහ පරිමාවෙන් ඉහළ යෑමේ ප්‍රතිඵලයක් වශයෙන් තත් කලාපය හා ලංකාව අතර වූ ආයාත කොටස වටිනාකමින් සියයට 4ට මදක් අඩුවෙන් ඉහළ ගියේ ය. 1959 දී මේ කලාපයත් සමඟ වූ වෙළඳාමෙන් රුපියල් කෝටි 17·8ක වෙළඳ අවාසියක් ලංකාවට හිමි විය. මෙය 1954ට පෙරාතුව පැවති වෙළඳාම් තත්ත්වයට වැටීමට හේතු විය.

රන් පවුම් කලාපය සමඟ වූ වෙළඳ අවාසිය හා සසඳන විට 1959 දී රු. කෝටි 10·4ක මදක් වැඩි වෙළඳ අතිරික්තයක් **ඩොලර් කලාපය** සමඟ වූ වෙළඳාම පෙන්නුම් කෙළේය. මෙය 1958ට වඩා මද දියුණුවක් පෙන්නුව ද ගිය අවුරුදු පහ තුල වූ සාමාන්‍ය අතිරික්තයෙන් සියයට 27කින් පමණ අඩුය. රබර් සහ පොල් නිෂ්පාදිත පරිමාව ඉහළ නැඟීමේ ප්‍රතිඵලයක් වශයෙන් නිර්යාතවල වටිනාකම සියයට 16කින් වැඩි විය. එහෙත් තේ නිර්යාත වටිනාකමෙහි සතුටුදයක තත්වයට බොහෝ සෙයින් ඉවහල් වූයේ ඇමෙරිකා එක්සත් ජනපදය රබර් විශාල ප්‍රමාණයක් මිලයට ගැනීමය. එබැවින් 1959 දී ඩොලර් කලාපයේ ආයාත සියයට 25කින් වැඩි විය. ආයාත වටිනාකම සැළකිය යුතු ලෙස ඉහළ නැංගේ විශේෂයෙන් හාල්, පිටි සහ කිරි නිෂ්පාදිත වලිනි. හාල්, පිටි සහ කිරි නිෂ්පාදිතයන්ගෙන් වැඩි කොටසක් විශේෂ ආධාර වැඩ පිළිවෙලවල් යටතේ ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ලැබිණ.

ගිය අවුරුදු කීපය තුල කෙරුණ විදේශීය වෙළඳාමෙන් සියයට 9ක් පමණ වූයේ **යුරෝපීය ආර්ථික ප්‍රජාව** සමඟය. යුද්ධයෙන් පසු මුල් අවුරුදුවල දී මේ කලාපය සමඟ වෙළඳාමෙන් ලංකාවට නොකඩවා වෙළඳ අතිරික්තයක් ලැබුණේය. නමුත් 1956න් පසු, ප්‍රධාන වශයෙන් නිර්යාතයන්ගේ වටිනාකම පහළ වැටීම නිසා සෑම අවුරුද්දක දීම ලංකාවට සුළු හිඟයක් ඇති වන අතට හැරුණි. එසේ වුව ද, 1959 දී යුරෝපීය ආර්ථික ප්‍රජාව සමඟ කළ වෙළඳාමෙන් ලංකාවට රුපියල් කෝටි 1.7ක වෙළඳ අතිරික්තයක් හිමි විය. රබර් සහ පොල් තෙල් නිර්යාතයන්ගේ ඉහළ යාමත් සමඟ ම 1959 යේ දී නිර්යාත වටිනාකම සියයට 41කින් ඉහළ ගියේය. ඉහළ ගිය නිර්යාත වටිනාකමෙන් සියයට 61ක් ම පොල් තෙල් වලින් ලැබූ ඉපැයුම් නිසා විය. යු. ආ. ප්‍ර. රටවල් අතරින් 1959 දී ලංකාවෙන් පෙරට වඩා භාණ්ඩ මිලයට ගත්තේ ඉතාලිය, නෙදර්ලන්තය හා ජර්මනියයි. 1959 දී යු. ආ. ප්‍ර. රටවල ලංකාවේ ආයාත රුපියල් කෝටි 2·6 කින් හෙවත් සියයට 16කින් ඉහළ ගියේය. වටිනාකම වැඩි වශයෙන් ඉහළ නැංගේ පෝර, යන්ත්‍රෝපකරණ හා රථවාහන සම්බන්ධයෙනි.

**චීන-ලංකා වෙළඳාම** පවත්වා ගෙන යනුයේ ද්විපාර්ශ්වික වෙළඳ සහ ගෙවීම් ගිවිසුම් අනුවය. ලංකාව හා චීනය අතර වූ පළමු වැනි ද්විපාර්ශ්වික වෙළඳ ගෙවීම් ගිවිසුම 1952 සමාප්ත කෙරිණ. එතැන් සිට, අනුක්‍රමයෙන් අලුත් කරන ලදි. 1959 ජනවාරි පළමු වැනිද ක්‍රියාත්මක වූ 1959 දී බඩු හුවමාරුව පිළිබඳ ගිවිසුම් පිටපත අනුව ලංකාවෙන් අවම වශයෙන් රබර් මෙට්‍රික් ටොන් 30,000ක් චීනයට යැවීමටත්, චීනයෙන් අවම වශයෙන් සහල් මැට්‍රික් ටොන් 2,30,000ක්

ලංකාවට එවීමටත් තීරණය විය. දෙරට අතර ආයාත නිර්යාතයන්හි මුළු වටිනාකම රුපියල් කෝටි 9·46කට නියම කරන ලදි. රුපියල් කෝටි 12·46කට සීමා වෙන පරිදි ලංකාවෙන් රබර් මැට්රික් ටොන් 35,000ක් සහ අනිකුත් බඩු චීනයට යැවීමටත්, මැට්රික් ටොන් 2,70,000ක සහල් සහ අනිකුත් භාණ්ඩ චීනයෙන් ලංකාවට එවීමටත් ගිවිසුමේ මුල් පිටපතට අමතරව ඇති උපලේඛනයෙකින් විකල්ප වශයෙන් ඉඩ සලසා තිබුණි.

1959 ආයාත නිර්යාතයන්හි නියම වටිනාකම රුපියල් කෝටි 22·8ක් විය. මෙය අවම ඉලක්කයට වඩා රුපියල් කෝටි 3·9කින් ඉහළ නැංග ද, විකල්ප ඉලක්කයට රුපියල් කෝටි 2.1කින් අඩු විය. 1959 දී චීනයට යැවුන ලංකාවේ නිර්යාතයන්හි වටිනාකම 1958 වේ වටිනාකමට සමාන වුව ද ආයාත සියයට 1කින් පමණ වැටිණ. ලංකාව චීනයෙන් ලබා ගත් ප්‍රධාන ආයාත වූයේ සහල් සහ රෙදිපිළිය. 1958ට වඩා 1959 දී සහල් ආයාතය සියයට 12කින් වැඩි වූ නමුත් ආයාත මිල අඩුවීම නිසා සහල් සඳහා වූ සම්පූර්ණ වියදම වැඩිවූයේ රුපියල් හැට ලක්ෂයකින් පමණකි. 1959 චීනයෙන් ගෙන්වූ රෙදිපිළිවල වටිනාකම රුපියල් කෝටි 9ක් විය. මෙය 1958 වටිනාකම මෙන් දෙගුණයෙකි. යකඩ සහ වානේ ආයාත ද වටිනාකමින් ඉහළ නැංගේය. සිමෙන්ති, විදුලි භාණ්ඩ සහ යන්ත්‍ර සූත්‍ර, අනිකුත් ආයාත අතර ප්‍රධාන තැනක් ගත්තේ ය.

චීනයෙන් ලබා ගන්නා ආයාතයන්ගේ වටිනාකම කෙමෙන් ප්‍රසාරණය වෙමින් පවතී. නමුත් රේගු සංඛ්‍යාවලට ආර්ථික ආධාර වශයෙන් ලැබෙන සහල් ද ඇතුළත්ව ඇති බව සැළකිය යුතු ය. 1959 දී මෙහි වටිනාකම රුපියල් කෝටි 1·03ක් විය. නිර්යාත වටිනාකම ආයාත පමණ වේගයෙන් ප්‍රසාරණය වූයේ නොවේ. එබැවින් 1959 දී දෙ වන වරට ද ලංකාවට වෙළඳ අවාසියක් විය. නමුත් 1958 වෙළඳ අවාසියට වඩා 1959 දී අවාසිය රුපියල් විසි ලක්ෂයකින් අඩු විය.

ලංකාවට සහල් සපයන්නෙකු වශයෙන් චීනයට අනුක්‍රමයෙන් හිමි වී ඇත්තේ ප්‍රධාන ස්ථානයකි. පසුගිය අවුරුදු පහ තුල දී ලංකාවේ මුළු සහල් ආයාතයෙන් සියයට 43ක් පමණ එ රටින් ලබා ගෙන ඇත. එලෙස ම එම කාලයේ දී ම ලංකාවේ මුළු රබර් නිර්යාතයෙන් සියයට 40ක් ම ගැනීමෙන් චීනය ලංකාවේ රබර්වලට ප්‍රධාන වෙළඳ පොලක් විය.

**සටහන 1—17**

**චීන ලංකා වෙළඳාම**

| වර්ෂය | නිර්යාත | | ආයාත | | වෙළඳ ශේෂය |
|---|---|---|---|---|---|
| | වටිනාකම රු. දශ ලක්ෂ | සම්පූර්ණ දේශීය නිර්යාතයන්ගේ සියයට ගණන | වටිනාකම රු. දශ ලක්ෂ | සම්පූර්ණ දේශීය ආයාතයන්ගේ සියයට ගණන | රු. දශ ලක්ෂ |
| 1955 .. .. | 121 | 6.5 | 80 | 5.3 | +41 |
| 1956 .. .. | 182 | 11.0 | 134 | 8.2 | +48 |
| 1957 .. .. | 167 | 10.5 | 84 | 4.6 | +83 |
| 1958 .. .. | 78 | 4.7 | 152 | 8.8 | —74 |
| 1959 .. .. | 78 | 4.6 | 150 | 7.5 | —72 |

ලංකා රේගු වාර්තා අනුවය.

**එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව හා අනිකුත් නැගෙනහිර යුරෝපීය රටවල්*** සමඟ ඇති කරගන්නා ලද වෙළඳ සහ ගෙවීම් ගිවිසුම්, අවුරුද්ද තුල ක්‍රියාත්මක වෙමින් පැවතිණ. අවුරුද්දේ අවසාන භාගයේ දී, එක් වර්ෂයකට බල පවත්වන, වෙළඳ සහ ගෙවීම් ගිවිසුමක් පෝලන්තය සමඟ ඇති කර ගත්තේ ය. 1959 මේ රටවලට කරුණු නිර්යාත මට්ටමෙහි සැළකිය යුතු වෙනසක් ඇති නොවිය. 1958 දී මෙන් ම, මේ රටවලට කැරුණ නිර්යාතයන්, සම්පූර්ණ දේශීය නිර්යාතයන්ගෙන් සියයට එකකට මදක් වැඩි විය. මේ කලාපයට යැවූ නිර්යාතයන්ගේ විශාලම කොටස වූයේ එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුවට යැවූ රබර්ය.

මේ රටවලින් ගෙන්වූ ආයාතයන්ගේ වටිනාකම ඉහළ නැඟ ඇත්තේ චෙකෝස්ලෝවැකියාවෙන් සහ පෝලන්තයෙන් ගෙන්වූ සීනි සාදන යන්ත්‍රෝපකරණ නිසාය. රුපියල් කෝටි 2·34ක් වූ ආයාතයන්ගෙන් රුපියල් කෝටි 1·23ක් ම මේ සඳහා විය.

* බල්ගේරියාව, චෙකෝස්ලොවේකියාව, හන්ගේරියා හා පෝලන්තය.

### සටහන !—18

### එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව හා නැගෙනහිර යුරෝපීය රටවල් අතර වෙළඳාම

| වර්ෂය | නිර්යාත | | ආයාත | | වෙළඳ ශෙෂය |
|---|---|---|---|---|---|
| | වටිනාකම රු. දශ ලක්ෂ | සම්පූර්ණ දේශීය නිර්යාත යන්හි සියයට ගණන | වටිනාකම රු. දශ ලක්ෂ | සම්පූර්ණ ආයාතයන්හි සියයට ගණන | රු. දශ ලක්ෂ |
| 1956 .. .. ... | 1.3 | 0.08 | 7.6 | 0.47 | — 6.3 |
| 1957 .. .. .. | 6.5 | 0.41 | 9.9 | 0.55 | — 3.4 |
| 1958 .. .. .. | 24.7 | 1.49 | 8.7 | 0.51 | + 16.0 |
| 1959 .. .. .. | 27.3 | 1.56 | 23.4 | 1.16 | + 3.9 |

සංඛ්‍යා—ලංකාවේ රේගු වාර්තාවලිනි.

## ඇ මිල, වැටුප් සහ රැකී රක්ෂා

ජීවන වියදම් දර්ශකය සංශොධනය කිරීමට පත් කළ රජයේ කොමිටිය විසින් 1959 ජූලි මාසයේදී වාර්තාවක් පළ කරන ලදී. ජීවන වියදම් දර්ශකයේ විවිධ භාණ්ඩයන් පිළිබඳ බරතැබීම් වෙනස් කරන ලෙස මේ කොමිටිය විසින් නිර්දේශ කරන ලදී.

**මිල සහ ජීවන වියදම්.** කොළඹ කම්කරු පන්තියේ සාමාන්‍ය පවුලක අයවැය අනුව, සංඛ්‍යා සහ ජනලේඛන දෙපාර්තමේන්තුව විසින් සකස් කර තිබෙන පාරිභෝජක මිල ගණන් දර්ශක යෙහි පසුගිය තුන් අවුරුද්ද තුල ඇති වූ වෙනස් වීම් පහත දක්වෙයි.

### සටහන (1—19)

### කොළඹ පාරිභෝජන මිල දර්ශකය (1952=100)

| වර්ෂය | සියලු ශීර්ෂ | ආහාර (සියයට 61.9) | රෙදිපිළි (සියයට 9.4) | ඉන්ධන (සියයට 4.3) | ගෙවල් කුලී (සිය යට 5.7) | විවිධ (සියයට 18.7) | දේශීය ගණය (සිය යට 51) | ආයාත ගණය'(සි යයට44) | නිර්යාත ගණ (සි යයට 5) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1957 .. | 102.8 | 104.9 | 84.4 | 97.3 | 101.5 | 106.9 | 104.9 | 91.8 | 126.8 |
| 1958 .. | 105.0 | 105.8 | 87.5 | 101.0 | 101.5 | 113.1 | 109.2 | 97.0 | 135.0 |
| 1959 .. | 105.2 | 104.7 | 92.1 | 102.4 | 101.5 | 115.3 | 108.0 | 97.1 | 153.1 |

සංඛ්‍යා—සංඛ්‍යා හා ජනලේඛන දෙපාර්තමේන්තුවෙන් හා ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

මාස්පතාවූ දශීකයේ වෙනස්වීම් පහත දක්වෙ.

### සටහන (1—20)

### කොළඹ පාරිභෝජක මිල දර්ශකයේ වෙනස්වීම්

| මාසය | සියලු ශීර්ෂ | | | ආයාත ගණය | | | දේශීය ගණය | | | නිර්යාත ගණය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1958 | 1959 | සියයට වෙනස | 1958 | 1959 | සියයට වෙනස | 1958 | 1959 | සියයට වෙනස | 1958 | 1959 | සියයට වෙනස |
| ජනවාරි .. | 106.3 | 105.0 | —1.2 | 99.3 | 96.1 | —3.2 | 110.0 | 108.7 | —1.2 | 133.6 | 150.8 | +12.9 |
| පෙබරවාරි .. | 105.8 | 103.5 | —2.2 | 99.2 | 96.0 | —3.2 | 109.0 | 106.0 | —2.8 | 134.1 | 149.1 | +11.2 |
| මාර්තු .. | 104.8 | 104.4 | —0.4 | 98.8 | 96.2 | —2.6 | 107.6 | 107.3 | —0.3 | 132.0 | 151.8 | +15.0 |
| අප්‍රේල් .. | 104.6 | 105.8 | +1.1 | 99.0 | 96.8 | —2.2 | 107.0 | 109.5 | +2.3 | 132.1 | 152.9 | +15.7 |
| මැයි .. | 105.2 | 105.4 | +0.2 | 99.3 | 97.0 | —2.3 | 107.6 | 108.5 | +0.8 | 134.9 | 154.2 | +14.3 |
| ජූනි .. | 104.5 | 106.2 | +1.6 | 95.2 | 96.7 | +1.6 | 110.4 | 110.0 | —0.4 | 128.9 | 155.4 | +20.6 |
| ජූලි .. | 103.2 | 105.6 | +2.3 | 94.4 | 97.4 | +3.2 | 108.7 | 108.6 | —0.1 | 127.8 | 153.6 | +20.2 |
| අගෝස්තු .. | 104.4 | 104.7 | +0.3 | 95.4 | 97.1 | +1.8 | 110.2 | 107.1 | —2.8 | 127.9 | 152.3 | +19.1 |
| සැප්තැම්බර් | 104.5 | 104.4 | —0.1 | 95.5 | 97.1 | +1.7 | 109.9 | 106.5 | —3.1 | 130.9 | 152.4 | +16.4 |
| ඔක්තෝබර් | 100.2 | 105.4 | —0.8 | 96.0 | 98.0 | +2.1 | 112.3 | 107.6 | —4.2 | 136.4 | 153.3 | +12.4 |
| නොවැම්බර් | 105.7 | 106.3 | +0.6 | 96.7 | 98.5 | +1.9 | 109.9 | 108.5 | —1.3 | 147.9 | 158.7 | + 7.3 |
| දෙසැම්බර් .. | 104.2 | 105.7 | +1.4 | 95.1 | 98.6 | +3.7 | 107.7 | 107.6 | —0.1 | 153.9 | 152.8 | + 0 7 |
| සාමාන්‍ය .. | 105.0 | 105.2 | +0.2 | 97.0 | 97.1 | +0.1 | 109.2 | 108.0 | —1.1 | 135.0 | 153.1 | +13.4 |

සංඛ්‍යා—සංඛ්‍යා සහ ජනලේඛන දෙපාර්තමේන්තුවෙන් හා ශ්‍රී ලංකා මහ බැංකුවෙනි,

කොළඹ පාරිභෝජකයින් ගේ මිල දර්ශකය අනුව සිල්ලර මිල වට්ටම 1958 ට වඩා 1959 දී සියයට 0.2 කින් ඉහළ ගොස් තිබිණ.

සියලු භාණ්ඩ ගණ දර්ශකයන් සම්මිශ්‍රණව පරීක්ෂා කර බැලීමේ දී 1959 යේ දී ආහාර වර්ග වල මිල සියයට 1.0 කින් පහළ ගිය බව පෙනේ. නිපදවන ස්ථාන අනුව ආහාර ද්‍රව්‍ය වර්ගකර බැලීමේ දී ඒ ඒ උප වර්ග ගණයන් ගේ මිල ගණන්වල පහත දැක්වෙන වෙනස් කම් හෙළි වෙයි.

### ස්ටහන 1—21

### පාරිභෝජක මිල දර්ශකයේ ආහාර ගණයන් පිළිබඳ මිල දර්ශක

| වර්ෂය | සියලුම ආහාර වර්ග | දේශීය ආහාරවර්ග | නිර්යාත ආහාර වර්ග | ආයාත ආහාර වර්ග |
|---|---|---|---|---|
| 1957 .. .. .. | 104.9 | 104.4 | 126.8 | 101.7 |
| 1958 .. .. .. | 105.8 | 108.9 | 135.0 | 98.3 |
| 1959 .. .. .. | 104.7 | 104.4 | 153.1 | 97.0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1959 දී දේශීය ආහාර වර්ගයන්ගේ මිල ගණන් සියයට 4.1 කින් පහළ වැටීමට හේතු වූයේ ප්‍රධාන වශයෙන් අලුත් මාලු, පළතුරු හා එළවලු මිල අඩු වීම නිසාය. 1958 දී මේ ද්‍රව්‍යයන් ගේ මිල ඉහළ නැග තිබුනේ ජාතිවාදී අරගල නිසා බෙද හැරීම අපහසු වූ බැවිනි. 1959 යේ දී නිර්යාත ආහාර ගණයේ දර්ශකය සියයට 13.4 කින් ඉහළ ගිය අතර ආයාත ආහාර ගණයේ දර්ශකය සියයට 1.3 කින් පහළ බැස්සේ ය. නිර්යාත ආහාර ගණයේ දර්ශකය ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ නිර්යාත මිල ඉහළ යාම නිසා පොල් නිෂ්පාදිතයන් ගේ මිල වැඩි වීමය. 1959 ආයාත ගණයේ දර්ශකය පහළ බැසීම 1958 මැද හරියේ සලාක හාල් මිල ශත 5 කින් අඩුවීම පිළිබිඹු කරයි. මේ කාලය තුළ දී පිටි සහ සීනි මිළ ගණන් වල වෙනසක් නොවූ අතර, අනිකුත් ආයාත ආහාර දර්ශකය ඉහළ නැංගේය. නමුත් සියලු ආයාත ආහාර සඳහා වූ මිල දර්ශකය පහළ බැස්සේ ය. මේ උපනිතිය පහළ සටහනින් හෙළි වෙයි.

### සටහන 1—22

### පාරිභෝජක මිල දර්ශකයේ ආයාත ගණයේ ආහාර වර්ගවල මිල වෙනස්වීම

| වර්ෂය | සියලු ආයාත ආහාර | සහල් පිටි සහ සීනි | අනිකුත් ආයාත ආහාර |
|---|---|---|---|
| 1957 .. .. .. .. | 101.7 | 101.7 | 101.7 |
| 1958 .. .. .. .. | 98.3 | 96.1 | 100.9 |
| 1959 .. .. .. .. | 97.0 | 92.2 | 102.7 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

පාලනය කළ ගෙවල් කුලී හැරෙන්නට පාරිභෝජක මිල දර්ශකයේ ඇති සියලුම මිල 1957 සිට වැඩිවෙමින් තුබුණු බව දැක්වේ. රෙදි පිළි දර්ශකයේ ඉහළ යාමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ආයාත මිළ ඉහළ යාමය. මෙය දේශීය රෙදිපිළි කර්මාන්තය ආරක්ෂා කිරීමේ රජයේ ප්‍රතිපත්තිය අඩංගු කාර්මික නිෂ්පාදන පණත නිසා ද විය හැකි ය. මත් පැන් සහ දුම්කොළ, විවිධ භාණ්ඩ ගණයේ භාණ්ඩවලින් තුනෙන් එකක් පමණ වෙයි. සුරා බදු වැඩිවීමෙන් මේ ද්‍රව්‍යයන් ගේ මිල ඉහළ ගියේ ය.

වැටුප්. කම්කරු දෙපාර්තමේන්තුව වැටුප් ප්‍රමාණය පිළිබඳ දර්ශකයන් සකස් කරයි. වැටුප් වෙනස්වීම් පිළිබඳ තොරතුරු ලැබී ඇත්තේ වැටුප් මණ්ඩල පත් කර තිබෙනකර්මාන්තයන් හි නියුතු කම්කරුවන්ගේ හා රජයේ නුපුහුණු කම්කරුවන්ගේත් පමණෙකි. සියලුම වැටුප් මණ්ඩල වලට අයත් කම්කරුවන්ගෙන් සියයට 89.4 ක් ම කෘෂිකර්මයේ නියුතු කම්කරුවෝ ය.

වැටුප් මණ්ඩලවලට අයත් සහ රජයේ නුපුහුණු කම්කරුවන්ගේත් ගිය අවුරුදු කීපයතුලවූ වැටුප් වෙනස් වීම් පහළ සටහනෙන් දැක්වේ.

**සටහන 1—23**

**අවම වැටුප් දර්ශකය (1952 — 100)**

| කාල ඡේදය | කෘෂිකර්මයේ නියුතු කම්කරුවෝ | | කෘෂිකර්ම නොවන වෘත්තීන්හි නියුතු කම්කරුවෝ | | කෘෂිකර්මයෙහි හා කෘෂිකර්මය නොවන වෘත්තීන්හි නියුතු | | රජයේ නුපුහුණු කම්කරුවෝ | |
|---|---|---|---|---|---|---|---|---|
| | අවම වැටුප් ප්‍රමාණය | මූර්ත වැටුප් පරිමාව | අවම වැටුප් ප්‍රමාණය | මූර්ත වැටුප් ප්‍රමාණය | අවම වැටුප් ප්‍රමාණය | මූර්ත වැටුප් ප්‍රමාණය | Minimum අවම වැටුප් ප්‍රමාණය | මූර්ත වැටුප් ප්‍රමාණය |
| 1953 .. | 101 ·5 | 99 ·9 | 101 ·0 | 99 ·4 | 101 ·5 | 99 ·9 | 101 ·3 | 99 ·7 |
| 1954 .. | 103 ·1 | 102 ·0 | 100 ·7 | 99 ·6 | 102 ·5 | 101 ·4 | 101 ·4 | 100 ·3 |
| 1955 .. | 106 ·6 | 106 ·1 | 101 ·4 | 101 ·0 | 105 ·9 | 105 ·4 | 105 ·8 | 105 ·2 |
| 1956 .. | 107 ·1 | 106 ·9 | 102 ·9 | 102 ·7 | 106 ·4 | 106 ·2 | 107 ·2 | 107 ·0 |
| 1957 .. | 108 ·7 | 105 ·6 | 104 ·5 | 101 ·5 | 107 ·8 | 104 ·7 | 110 ·4 | 107 ·3 |
| 1958 .. | 110 ·2 | 105 ·2 | 116 ·2 | 110 ·9 | 110 ·8 | 105 ·6 | 126 ·7 | 120 ·7 |
| 1959 .. | 110 ·2 | 104 ·8 | 128 ·8 | 122 ·4 | 112 ·3 | 106 ·7 | 126 ·7 | 120 ·4 |

සංඛ්‍යා—සංඛ්‍යා හා ජනලේඛන දෙපාර්තමේන්තුවෙන් හා ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1957 දක්වා කෘෂිකර්මයෙහි නියුතු නොවන කම්කරුවන්ගේ වැටුප් ප්‍රමාණය කෘෂිකර්මයෙහි නියුතු කම්කරුවන්ගේ වැටුප් ප්‍රමාණයට වඩා ඉහළ නැංගේ අඩු ශීඝ්‍රතාවකිනි. 1958 දී, කෘෂිකර්මයෙහි නියුතු නොවන කම්කරුවන් ගේ වැටුප් ප්‍රමාණය වැඩි විය. මේ වැඩිවීම 1959 මුලුල්ලේම පැවති බැවින් කෘෂිකර්මයෙහි නියුතු නොවන කම්කරුවන්ගේ වැටුප් දර්ශකය පසුගිය අවුරුද්දට වඩා සියයට 10.8 කින් ඉහළ නැංගේය.

වැටුප් මණ්ඩල මගින් අවම වැටුප් ප්‍රමාණය නියම කර ඇති කම්කරුවන් වැඩි දෙනෙකුගේ වැටුප්වල සැලකිය යුතු වෙනසක් 1959 දී ඇති නොවීය. මෙයින් බැහැර වූයේ පොල් වගාව සහ ගිනිපෙට්ටි කර්මාන්තය යන වෘත්තීන් පමණෙකි. 1959 දෙසැම්බර් පළමු වැනිදා සිට පොල් වගාවේ නියුතු කම්කරුවන් ගේ මූලික පඩිය සියයට 11.0 කින් වැඩි විය. ගිනිපෙට්ටි කර්මාන්තයෙ නියුතු කම්කරුවන් ගේ පඩිය, 1959 ජූනි මාසයේ 1 වැනි ද සිට විශෙෂ ජීවන වියදම් දීමනාව වැඩිකළ නිසා සියයට 9.1 කින් වැඩි විය.

නුපුහුණු රජයේ කම්කරුවන්ගේ වැටුප් ප්‍රමාණය 1958 දක්වා අනුක්‍රමයෙන් වැඩි වූ බැවින් 1952 ට වඩා සියයට 26.7 කින් ඉහළ නැඟ තිබිණ. 1959 යේ ඔවුන්ගේ වැටුප් ප්‍රමාණයන් නො වෙනස්ව පැවතුනි. රජයේ පුහුණු කම්කරුවන් ගේ වැටුප් ප්‍රමාණ දර්ශක ලබා ගැනීමට නොමැත.

ජීවන වියදම් ඉහළ යාමේ හේතුවෙන් කෘෂිකාර්මික සහ රජයේ නුපුහුණු කම්කරුවන් ගේ මූර්ත වැටුප් ප්‍රමාණය සියයට 0.4 කින් සහ 0.3 කින් පහළ වැටිණ. නමුත් කාර්මික සහ වාණිජ කම්කරුවන් ගේ වැටුප් ඉහළ යාම ජීවන වියදම් වැඩිවීමටත් වඩා අධික වූ බැවින් නියම වැටුප් ප්‍රමාණය සියයට 10.4 කින් ඉහළ නැංගේ ය.

**සේවක අර්ථසාධක අරමුදල.** 1958 සේවක අර්ථසාධක අරමුදල් පණතේ පරිපාලනයට විටින් විට යම් යම් රැකී රක්ෂා ඇතුලත් කරගනු ලැබීය. 1958 දෙසැම්බර් පළමු වැනි ද සිට සියලු රජයේ සහ අර්ධ රාජ්‍ය සමායතනයන්, වාණිජ ආයතනයන්, බැංකු, සිනමාහල්, සාත්තු නිවාස, ගණන් පරීක්ෂණායතන, ගණකාධිකාර ආයතන, රක්ෂණ සමාගම්, හෝටල්, සමුපාකාර- සමාගම්, අක්කර 10 කට වැඩි වතු සහ අනිකුත් සියලුම වැටුප් මණ්ඩල යටතට පත්වන කර්මාන්ත, මේ පණතේ පාලනය යටතට ගන්නා ලදී. මේ යෝජනා ක්‍රමයට ඇතුලත් වූ රැකී රක්ෂා ප්‍රමාණය 8,000 කට වැඩිය. 1959 දෙසැම්බර් 31 වැනි ද වන විට, 6, 700 කට පමණ ආසන්න වූ රැකී රක්ෂා ප්‍රමාණයක් කම්කරු කොමසාරිස් වරයා වෙත ලියා පදිංචි කරන ලදී. මෙසේ ලියා පදිංචි වූ රැකී රක්ෂාවන්හි නියුතු 6,00,000 පමණ සේවකයන් මේ පණතේ පාලනයට පත්ව ඇත.

**රැකී රක්ෂා.** 1959 දී කම්කරු දෙපාර්තමේන්තුව මගින් රක්ෂා සහිත සහ අර්ධ රක්ෂා සහිත වූවන් පිළිබඳ සමීක්ෂණයක් පැවැත් වූ නමුත් එහි ප්‍රතිඵල තවම ලැබී නැත.

ලංකාවේ රැකී රක්ෂා රහිත වූවන්ගේ ගණන පිළිබඳ නියම සංඛ්‍යා තොරතුරු තවම ලැබී නැත. රක්ෂා හෝ වඩා හොඳ රක්ෂා ලබා ගැනීම සඳහා කොළඹ, හා ප්‍රධාන ප්‍රාදේශික නගර 19 ක රැකී රක්ෂා කාර්යාලයන්හි ලියා පදිංචි වී ඇති අය පිළිබඳව තොරතුරු පහත දැක්වෙන සටහනින් දැක්වෙයි. එයින්, රැකී රක්ෂා නොමැති වූවන් ගේ ප්‍රමාණයන්හි වෙනස්වීම්ද පෙන්නා දෙයි.

### සටහන 1—24

### රැකී රක්ෂා කාර්‍යාලවල ලියා පදිංචි වූවන්ගේ ගණන

| කාල ඡේදය | ගණන | දර්ශකය |
|---|---|---|
| 1938 ... ... ... ... ... ... ... ... | 16,480 | 100 |
| 1952 ... ... ... ... ... ... ... ... | 53,023 | 322 |
| 1953 ... ... ... ... ... ... ... ... | 51,546 | 313 |
| 1954 ... ... ... ... ... ... ... ... | 63,304 | 384 |
| 1955 ... ... ... ... ... ... ... ... | 71,010 | 431 |
| 1956 ... ... ... ... ... ... ... ... | 85,952 | 522 |
| 1957 ... ... ... ... ... ... ... ... | 110,856 | 673 |
| 1958 ... ... ... ... ... ... ... ... | 117,796 | 715 |
| 1959 පළමු වැනි කාර්තුව ... ... ... ... ... ... | 119,614 | 726 |
| දෙ වැනි කාර්තුව ... ... ... ... ... ... ... | 122,941 | 746 |
| තුන් වැනි කාර්තුව... ... ... ... ... ... ... | 126,759 | 769 |
| හතර වැනි කාර්තුව ... ... ... ... ... ... ... | 128,018 | 777 |

සංඛ්‍යා—කම්කරු දෙපාර්තමේන්තුවෙනි.

1953 සිට ලියා පදිංචි කරනු ලැබූවන්ගේ සංඛ්‍යාවෙහි ඉහළ නැඟීම එසේ ම පැවතිණ. වර්ෂාවසානයේ දී ලියා පදිංචි වූවන්ගේ මුළු ගණන 1958 ට වඩා සියයයට 8.7 කින් වැඩි විය. ලියා පදිංචි වූවන් අතර විශාල ලෙස වැඩි වී ඇත්තේ අර්ධ–පුහුණු සහ නුපුහුණු කම්කරුවන්ය. මෙහි වැඩිවීම සියයට 2.3 කින් සහ 16.0 කින් සිදු වී ඇත. (දෙවැනි පරිශිෂ්ටයේ 33 වැනි සටහන බලන්න.

**කම්කරු සම්බන්ධතා.** 1959 දී වූ වැඩ වර්ජන සංඛ්‍යාව 1958 ට වඩා අධික විය. නමුත් වැඩ වර්ජනයන්ගේ මුළු ගණන 1957 ට වඩා අඩුය. පසු ගිය වර්ෂ කීපය තුල වූ වැඩ වර්ජන පිළිවෙළ පහත සටහනේ දැක්වේ.

### සටහන 1—25

### වැඩ වර්ජන සහ නැති වූ මිනිස් දවස් සංඛ්‍යාව.

| වර්ෂය | වැවිලි | | අනිකුත් වෘත්තීන් | |
|---|---|---|---|---|
| | වැඩ වර්ජන ගණන | නැති වූ මිනිස් දවස් සංඛ්‍යාව | වැඩ වර්ජන ගණන | නැති වූ මිනිස් දවස් සංඛ්‍යාව |
| 1957 ... ... ... ... | 177 | 618,050 | 127 | 190,443 |
| 1958 ... ... ... ... | 123 | 340,632 | 79 | 292,577 |
| 1959* ... ... ... ... | 177 | 352,095 | 71 | 460,141 |

*තාවකාලිකයි.

සංඛ්‍යා—කම්කරු දෙපාර්තමේන්තුවෙනි

වැඩ වර්ජන විශාල සංඛ්‍යාවන් ඇති වූයේ කම්කරුවන්ගෙන් වැඩි කොටසක් වෘත්තීය සමිති යටතේ සංවිධානය වී සිටින වතුවල ය. 1957–58 දී මෙ වෘත්තීය සමිති 30 ක් යටතේ සංවිධානය වී සිටි කම්කරුවන්ගේ මුළු සාමාජික සංඛ්‍යාව 5,92,270 ක් විය. අනිකුත් වෘත්තීය සමිති යටතේ සංවිධානය වූ කම්කරුවන්ගේ මුළු ප්‍රමාණය 2,29,726 ක්විය. ඔවුහු වෘත්තීය සමිති 1397 කට අයත් වූහ. වෘත්තීය සමිති සහ සාමාජිකයන් දළ වශයෙන් වර්ග කොට පහත සටහනේ දක්වා ඇත.

**සටහන 1—26**

**කම්කරු කොමසාරිස්තුමාට වාර්තා එවූ කම්කරු සංගම්වල සංඛ්‍යා තොරතුරු (අ)**

| කම්කරු සමිති | සමිති සංඛ්‍යාව | | සාමාජික සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | 1957-58 | 1958-59* | 1957-58 | 1958-59* |
| 1. වැවිලි සහ කෘෂිකාර්මික ... ... ... ... | 27 | 30 | 552,498 | 592,270 |
| 2. කාර්මික ... ... ... ... ... ... | 65 | 69 | 65,669 | 58,851 |
| 3. ගමනාගමනය සහ පණිවුඩ හුවමාරු ... ... | 60 | 57 | 39,408 | 56,172 |
| 4. ලිපිකරු ... ... ... ... ... ... | 20 | 34 | 12,387 | 18,914 |
| 5. ශාස්ත්‍රීය වෘත්තීන් ... ... ... ... ... | 30 | 39 | 9,215 | 15,056 |
| 6. සාමාන්‍ය ... ... ... ... ... ... | 96 | 172 | 35,669 | 54,746 |
| 7. වාණිජ ... ... ... ... ... | 11 | 14 | 14,916 | 25,298 |
| 8. පාලක සහ විධායක .. ... ... ... ... | 8 | 12 | 416 | 689 |
| | 317 | 427 | 730,178 | 821,996— |

සංඛ්‍යා—කම්කරු දෙපාර්තමේන්තුවෙනි.

(අ) ලියාපදිංචි කළ අවුරුද්ද—අප්‍රේල් 1 වැනිද සිට මාර්තු 31 වැනිද දක්වා.

වැඩ වර්ජන හේතූන් පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුව විසින් කරන ලද වර්ග කිරීම අනුව වැඩ වර්ජන ඇතිකිරීමෙහි ලා, වැඩි පඩි ඉල්ලීම 1954 සිට එතරම් වැදගත් හේතුවක් නොවීය 1959 දී ද මෙය එසේම පැවතුණි. වැඩි පඩි ඉල්ලීම හේතුවක් වශයෙන් ගෙන 1958 කළ වැඩ වර්ජනයන් ගේ ගණන සියයට 4.4 ක් වූ අතර 1959 දී එය සියයට 3.2 ක් විය. සේවා තත්වය පිළිබඳ ආරාවුල් නිසා උද්ගත වූ වැඩ වර්ජන සියයට 30.2 ක් වූ අතර, අස්කිරීමෙන් හෝ වැඩ නැතිවීමෙන් සහ වැටුප් ආරාවුල් නිසා වූ වැඩි පඩි ඉල්ලීම් නොවන වැඩ වර්ජන සියයට 18.2 ක් සහ 16.1 ක් විය. 1958 දී මෙන් ම වැඩ වර්ජනවලට ප්‍රධාන හේතූන් වූයේ මේ කරුණු තුනය.

# 11 මූල්‍ය තත්වය

## (අ) මුදල් සැපයුම

මුදල් සැපයුම 1959 දී රුපියල් කෝටි 10.1 කින් හෙවත් සියයට 9.4 කින් වැඩි විය. 1958දී මුදල් සැපයුම ඉහළ ගියේ රුපියල් කෝටි 3.66 ක් හෙවත් සියයට 3.6 කින මේ අවුරුද්දේ මුදල් සැපයුමෙහි ඉහළ නැගීම පසු ගිය අවුරුද්දට වඩා නිරන්තරව පැවතිණ. 1958 ප්‍රථම භාගයේ දී මුදල් සැපයුම පහළ වැටුන අතර ඉහළ නැංගේ දෙ වැනි භාගයේ දී පමණෙකි. 1959 දෙ වැනි භාගයේ දී මුදල් සැපයුම අති විශාල ලෙස ඉහළ නැගුන ද, ප්‍රථම භාගයේ දී ද, මුදල් සැපයුමෙහි මද උච්චාවචනයක් ඇති වුවද, ජූනි මාසයේ අවසානය වන විට එය රුපියල් කෝටි 1.74 කින් ඉහළ නැංගේය. මෙයින් පසු පහළ සටහනේ පෙන්වා ඇති පරිදි මෙය එකාකාරවම රුපියල් කෝටි 8.35 කින් ඉහළ නැග දෙසැම්බර් මාසය වන විට, රුපියල් කෝටි 117.77 ක් විය. මෙය මුදල් සැපයුම නැඟ ඇති ඉහළම මට්ටම විය. 1959 දී රුපියල් කෝටි 110.7 ක් වූ මුදල් සැපයුමෙහි මාසික සාමාන්‍යය වූ 1958 වූ කෝටි 103.7 හා සසඳන විට සියයට 6.7 කින් වැඩි වී ඇත.

* තාවකාලිකයි.